විශේෂ සටහන 13

## ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස්වීම් සහ ක්‍රියාමාර්ග: 2018[1]

### මුදල් ප්‍රතිපත්තිය

| | | |
|---|---|---|
| 2018 අප්‍රේල් 04 | - | නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 25 කින් සියයට 8.50 දක්වා අඩු කරන ලද අතර නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සියයට 7.25 මට්ටමේ නොවෙනස්ව පවත්වා ගන්නා ලදී. මෙම තීරණය මගින් නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවේ පරාසය පදනම් අංක 150 සිට පදනම් අංක 125 දක්වා පටු විය. |
| 2018 නොවැම්බර් 14 | - | බලපත්‍රලාභී වාණිජ බැංකුවල සියලු රුපියල් තැන්පතු වගකීම් සඳහා අදාළ වන ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 2018 නොවැම්බර් 16 වන දිනෙන් ආරම්භ වන සංචිත කාලපරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි සියයට 7.50 සිට සියයට 6.00 දක්වා ප්‍රතිශතාංක 1.50 කින් අඩු කරන ලදී. |
| | - | නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50 කින් සියයට 9.00 දක්වාද, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය පදනම් අංක 75 කින් සියයට 8.00 දක්වා වැඩි කරන ලදී. නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව පදනම් අංක 125 සිට පදනම් අංක 100 දක්වා පටු කරන ලදී. |
| 2019 පෙබරවාරි 22 | - | බලපත්‍රලාභී වාණිජ බැංකුවල සියලු රුපියල් තැන්පතු වගකීම් සඳහා අදාළ වන ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 2019 මාර්තු 01 දිනෙන් ආරම්භ වන සංචිත කාලපරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි සියයට 6.00 සිට සියයට 5.00 දක්වා ප්‍රතිශතාංක 1.00 කින් අඩු කරන ලදී. |

### මූල්‍ය අංශය

### බලපත්‍රලාභී බැංකු

| | | |
|---|---|---|
| 2018 ජනවාරි 08 | - | 2018 අයවැය මගින් අනුමත කළ පරිදි, 2018 ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මෝටර් වාහන ආනයනය සඳහා භාවිතික (usance) ණයවර ලිපි නිකුත් නොකරන ලෙස දැනුම් දෙමින් බලපත්‍රලාභී බැංකු වෙත 2018 අංක 01 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී. |
| 2018 ජනවාරි 09 | - | 2018 අංක 01 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි නිකුත් කිරීම මගින් 2010 අංක 01 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි සංශෝධනය කරන ලදී. |
| 2018 පෙබරවාරි 08 | - | 2018 ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි විද්‍යුත්, දෙමුහුන් සහ අනෙකුත් ලියාපදිංචි නොකළ මෝටර් රථ සහ මෙරට තුළ ලියාපදිංචි කර වසරකට වැඩි/නොවැඩි වාහන සඳහා ලබා දෙන ණය පහසුකම්වලට අදාළව පනවා ඇති වටිනාකම මත ණය අනුපාත දැනුම් දෙමින් සියලුම බලපත්‍රලාභී බැංකු වෙත 2018 අංක 01 දරන බැංකු පනත් විධාන නිකුත් කරන ලදී. |
| 2018 මාර්තු 14 | - | අනේවාසිකයෙකු විසින් අක්වෙරළ බැංකු ඒකකයක නම් කරන ලද විදේශ මුදල් මගින් පවත්වාගෙන යන ගිණුමක් සඳහා 2017 අංක 12 දරණ විදේශ විනිමය පනත යටතේ අනුමත කරන ලද ගනුදෙනු සඳහා අවසර ලබා දෙමින් සියලුම බලපත්‍රලාභී බැංකු වෙත 2018 අංක 01 දරන බැංකු පනත් නියෝග (අක්වෙරළ බැංකු ව්‍යාපාර) නිකුත් කරන ලදී. |
| 2018 මැයි 24 | - | බලපත්‍රලාභී බැංකු විසින් නියෝජිතයන් පත්කිරීමේ දී අනුගමනය කළ යුතු නියාමන අවශ්‍යතා රාමුව පිළිබඳ දන්වමින් සියලුම බලපත්‍රලාභී බැංකු වෙත 2018 අංක 02 දරන බැංකු පනත් විධාන නිකුත් කරන ලදී. |

1 2017 වසර තුළ දී මෙන්ම 2017 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව ප්‍රකාශයට පත් කිරීම තෙක් 2018 වසර තුළ දී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස්වීම් සහ ක්‍රියාමාර්ග මෙන්ම නුදුරු අනාගතයේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ද මෙයට ඇතුළත් වේ.

| | | |
|---|---|---|
| 2018 ජුනි 05 | - | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය මගින් නම් කරනු ලබන කල්බදු ක්‍රමවේද යටතේ රජයේ ආයතන විසින් මෝටර් වාහන මිලදී ගැනීම පිණිස ලබා ගන්නා ණය පහසුකම් සඳහා වටිනාකම මත ණය අනුපාත සීමා බලපැවැත්වීම ඉවත් කරමින් 2018 පෙබරවාරි 08 දින නිකුත් කළ මෝටර් වාහන මත පනවා තිබූ වටිනාකම මත ණය අනුපාත පිළිබඳ බැංකු පනත් විධානය; 2018 අංක 03 දරන බැංකු පනත් විධාන මගින් සංශෝධනය කරන ලද අතර රජයේ ආයතන වෙත අදාල ණය පහසුකම් ලබා දීමේ දී අභ්‍යන්තර සීමා පවත්වා ගැනීමටත්, අවදානම් කළමනාකරණය සඳහා උචිත ක්‍රියාමාර්ග අනුගමනය කිරීමටත් බලපත්‍රලාභී බැංකු වෙත උපදෙස් ලබා දෙන ලදී. |
| 2018 අගෝස්තු 21 | - | මූල්‍ය ව්‍යුත්පන්න ගනුදෙනුවල අවදානම් කළමනාකරණය තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් 2018 අගෝස්තු 21 දින සිට ක්‍රියාත්මක වන පරිදි බලපත්‍රලාභී බැංකු සඳහා මූල්‍ය ව්‍යුත්පන්න ගනුදෙනු පිළිබඳව 2018 අංක 04 දරන බැංකු පනත් විධානය නිකුත් කරන ලදී. ඒ අනුව මූල්‍ය ව්‍යුපත්පන්න ගනුදෙනු සිදු කිරීමේදී අවදානම් කළමනාකරණය පිළිබඳව වඩාත් ආරක්ෂාකාරී ක්‍රියාමාර්ග අනුගමනය කරන ලෙස බැංකුවලට උපදෙස් ලබා දුන් අතර මෙම විධානයන් මගින් ව්‍යුපත්පන්න ගනුදෙනු ආරම්භ කිරීම, අධ්‍යක්ෂ මණ්ඩල විසින් අනුමත ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග, ගනුදෙනුකරුවන් දැනුවත් කිරීම, අනුමත නොකළ ක්‍රියාකාරකම් සහ වාර්තාකරණ අවශ්‍යතා වැනි අංශ ආවරණය කෙරේ. මේ සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කර ඇති විධානයන් මෙම විධානය මගින් අවලංගු කෙරේ. |
| 2018 අගෝස්තු 23 | - | රාජ්‍ය සේවයේ ක්ෂේත්‍ර නිලධාරීන් සහ දුෂ්කර පළාත්හි සේවයේ නියුතු ගුරුවරුන් සඳහා යතුරුපැදි මිලදී ගැනීමට රජය විසින් ලබාදෙනු ලබන යෝජිත සහනදායී කල්බදු පහසුකමට අදාළව 2018 පෙබරවාරි 08 දින නිකුත් කරන ලද 2018 අංක 01 දරණ මෝටර් වාහන මත පනවා ඇති වටිනාකම මත ණය අනුපාත පිළිබඳ බැංකු පනත් විධාන බලනොපැවැත්වෙන පරිදි 2018 අංක 05 දරන බැංකු පනත් විධාන මගින් එම විධාන තවදුරටත් සංශෝධනය කරන ලද අතර, එකී ණය පහසුකම් ලබා දීමේදී අභ්‍යන්තර සීමා පවත්වා ගැනීමටත්, අවදානම් කළමනාකරණය සඳහා උචිත ක්‍රියාමාර්ග අනුගමනය කිරීමටත් බැංකුවලට උපදෙස් ලබා දෙන ලදී. |
| 2018 සැප්තැම්බර් 19 | - | මෝටර් වාහන ආනයනය සඳහා ණයවර ලිපි ආරම්භ කිරීමේ දී සියයට සියයක අවම මුදල් ආන්තික තැන්පතුවක් පනවන ලදී. |
| | - | ඉහත සඳහන් පරිදි ණයවර ලිපි ආරම්භ කිරීමේ දී සිදුකරන අවම මුදල් ආන්තික තැන්පතු සඳහා සියයට සියයක අවම සංචිත අවශ්‍යතාව ද පනවන ලදී. |
| 2018 සැප්තැම්බර් 28 | - | 2018 පෙබරවාරි 08 දින නිකුත් කරන ලද මෝටර් රථ මත පනවා ඇති වටිනාකම මත ණය අනුපාතය පිළිබඳ බැංකු පනත් විධාන 2018 අංක 06 දරන බැංකු පනත් විධාන මගින් තව දුරටත් සංශෝධනය කරන ලදී. මේ අනුව, දෙමුහුන් මෝටර් කාර්, වෑන් රථ සහ ක්‍රීඩා උපයෝගී වාහන (SUV රථ) සඳහා අදාළ වටිනාකම මත ණය අනුපාත පහළ දමමින් එම විධානයන්හි විධාන 2.1 සංශෝධනය කරන ලද අතර නැවත දැනුම් දෙන තුරු ශ්‍රී ලංකා රජය විසින් සහනදායී පදනම යටතේ නිකුත් කරනු ලබන වාහන ආනයන බලපත්‍ර සඳහා ණයවර ලිපි නිකුත් කිරීමෙන් වළකින ලෙසට සියළුම බලපත්‍රලාභී බැංකු වෙත දැනුම් දෙන ලදී. |
| 2018 සැප්තැම්බර් 29 | - | මෝටර් වාහන ආනයනය සහ අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය සඳහා ණයවර ලිපි ආරම්භ කිරීමේ දී, පිළිවෙළින් සියයට දෙසීයක සහ සියයට සියයක අවම මුදල් ආන්තික තැන්පතුවක් පවත්වා ගැනීමේ අවශ්‍යතාව පනවන ලදී. |
| 2018 ඔක්තෝබර් 01 | - | 2018 සැප්තැම්බර් 29 දින පැන වූ ක්‍රියාමාර්ග සඳහා ණයවර ලිපි ආරම්භ කිරීමේ දී පවත්වා ගනු ලබන අවම මුදල් ආන්තික තැන්පතු සඳහා සියයට සියයක අවම සංචිත අවශ්‍යතාව පනවන ලදී. |
| 2018 ඔක්තෝබර් 11 | - | ප්‍රතිග්‍රහණය මත ලියවිලි ලබා දීමේ කොන්දේසිය යටතේ සිදු කරන අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය කරන ආනයනකරුවන්ගෙන් සියයට සියයක මුදල් ආන්තිකයක් රඳවා ගන්නා ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2018 ඔක්තෝබර් 12 | - | මෝටර් රථ වාහන සහ අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය සඳහා ණයවර ලිපි නිකුත් කිරීම හෝ වෙනත් ගෙවීම් පහසුකම් සැලසීමෙන් වැළකී සිටින ලෙසට ජාතික ඉතිරි කිරීමේ බැංකුව වෙත 2018 අංක 07 දරණ බැංකු පනත් විධාන නිකුත් කරන ලදී. |

| | | |
|---|---|---|
| 2018 ඔක්තෝබර් 18 | - | 2019 සහ 2020 වර්ෂ සඳහා වාර්ෂික බලපත්‍ර ගාස්තු ඊට පෙර වසර අවසානය වන විට බැංකුව සතුව පැවති මුළු වත්කම් ප්‍රමාණය මත පදනම්ව ගෙවිය යුතු ලෙසට බැංකු දැනුවත් කරමින් 2018 අංක 01 දරණ බැංකු පනත් තීරණය නිකුත් කරන ලදී. |
| 2018 නොවැම්බර් 21 | - | බාසල් III ද්‍රවශීලතා ප්‍රමිති යටතේ ශුද්ධ ස්ථායි අරමුදල් අනුපාතිකය හඳුන්වා දීම සම්බන්ධයෙන් 2018 අංක 08 දරණ බැංකු පනත් විධාන බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කළ අතර එමඟින් බලපත්‍රලාභී බැංකු විසින් 2019 ජනවාරි 01 වන විට සියයට 90 ක ශුද්ධ ස්ථායි අරමුදල් අනුපාතයක් පවත්වා ගත යුතු බවත්, 2019 ජූලි 01 වන විට එය සියයට සියය දක්වා ඉහළ නංවා ගැනීමට කටයුතු කළ යුතු බවත් දන්වන ලදී. |
| | - | බාසල් III ද්‍රවශීලතා ප්‍රමිති යටතේ ද්‍රවශීලතා ආවරණ අනුපාතය සම්බන්ධ නියාමන වාර්තාකරණයන්ගේ ආකෘති සංශෝධන පිළිබඳව දන්වමින්, 2018 අංක 09 දරණ බැංකු පනත් විධාන බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලදී. |
| 2018 නොවැම්බර් 26 | - | මෝටර් රථ වාහන සහ අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය සඳහා විදේශ මුදල් ගිණුම් හරහා ණයවර ලිපි විවෘත කිරීමේදී සියයට සියයක ආන්තික තැන්පතු අවශ්‍යතාවයක් පනවමින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. තවද, ණයවර ලිපි විවෘත කිරීමේදී ගිණුමෙහි පවත්වාගෙන යනු ලබන ආන්තික තැන්පතුව භාවිතා කොට එම ආනයන බිල්පත් පියවිය යුතු බව සහ අයිතමයේ වටිනාකමට වඩා අඩු වටිනාකමකට ඉන්වොයිසිය විවෘත නොකළ යුතු බවද දන්වන ලදී. |
| 2018 නොවැම්බර් 30 | - | 2018 බැංකු පනත් විධාන අංක 02 හි විධාන 06 සංශෝධනය කරමින් සහ ප්‍රතිස්ථාපනය කරමින් බලපත්‍රලාභී බැංකු වෙත නියෝජිතයන් පත් කිරීම සම්බන්ධයෙන් 2018 අංක 10 දරණ බැංකු පනත් විධාන නිකුත් කරන ලදී. |
| | - | 2018 නොවැම්බර් 30 දින සිට බලපැවැත්වෙන පරිදි විදේශ ව්‍යවහාර මුදලින් ණය ගැනීම සඳහා නව ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම පිළිබඳව දන්වමින් 2018 අංක 11 දරන බැංකු පනත් විධාන සියලුම බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලදී. මෙම නව විධානය මගින් 2017 අංක 07 දරණ බලපත්‍රලාභී බැංකුවල විදේශ ව්‍යවහාර මුදලින් ණය ගැනීම සම්බන්ධ බැංකු පනත් විධාන සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන ගණකාධිකාරී විසින් 1997 ජනවාරි 13 නිකුත් කරන ලද අංක BD/FX/196 දරණ චක්‍රලේඛය අවලංගු කරන ලදී. |
| | - | බලපත්‍රලාභී බැංකු විසින් විදේශ ව්‍යවහාර මුදලින් ණය ගැනීමේදී සහ නේවාසිකයන්ගෙන් විදේශ ව්‍යවහාර මුදලින් ණය ගැනීමේදී, 2018 අංක 11 දරණ බලපත්‍රලාභී බැංකු විසින් විදේශ ව්‍යවහාර මුදලින් ණය ගැනීම සම්බන්ධ බැංකු පනත් විධානයේ අඩංගු නියමයන් සහ කොන්දේසි අනුගමනය කරන ලෙස දන්වමින් 2018 අංක 02 දරණ බැංකු පනත් නියෝගය (අක්වෙරළ බැංකු ව්‍යාපාර) බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලදී. |
| 2018 දෙසැම්බර් 28 | - | 2019 ජනවාරි 01 සිට බලපැවැත්වෙන පරිදි බාසල් III රාමුව යටතේ අවම තෝලන අනුපාතය සියයට 3 ලෙස පවත්වාගෙන යන ලෙසට බලපත්‍රලාභී බැංකු දැනුම්වත් කරමින් බැංකු පනත යටතේ 2018 අංක 12 දරණ බැංකු පනත් විධාන නිකුත් කරන ලදී. |
| | - | ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි තෝලන අනුපාතයෙහි නිරාවරණ මිණුම (Exposure Measure) ගණනය කිරීමේදී, බැංකුව විසින් ඉතිරිකිරීමේ සහ තැන්පතු ගිණුම්වල ඇති මුදලින් රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනය කර ඇති සියයට 60 ප්‍රතිශතය බැහැර කිරීමට අනුමැතිය දක්වමින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2018 දෙසැම්බර් 31 | - | බැංකු ක්ෂේත්‍රය තුළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සංගතව සහ විචක්ෂණශීලීව අනුගමනය කිරීම සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - SLFRS 9: මූල්‍ය උපකරණ සඳහා මාර්ගෝපදේශ ක්‍රියාත්මක කරන ලෙස දන්වමින් බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2019 ජනවාරි 04 | - | විදේශ සේවකයින් බලපත්‍රලාභී බැංකුවල සේවයේ යෙදීම සඳහා අදාළ මාර්ගෝපදේශ පිළිබඳව දැනුවත් කරමින් බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කළ අතර මේ සම්බන්ධයෙන් කලින් නිකුත් කළ චක්‍රලේඛය අවලංගු කරන ලදී. |
| 2019 ජනවාරි 18 | - | බලපත්‍රලාභී බැංකුවල වාර්ෂික හා ත්‍රෛමාසික මූල්‍ය ප්‍රකාශ සහ අනෙකුත් හෙළිදරව් කිරීම් ප්‍රකාශන සම්බන්ධයෙන් නව ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව නව ආකෘති පිළිබඳ සහ ඒ සම්බන්ධ දැනට පවතින ආකෘති අවලංගු වන බව දැනුම්වත් කරමින් බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |

| | | |
|---|---|---|
| අපේක්ෂිත | - | නව බැංකු පනතක් කෙටුම්පත් කිරීම |
| | - | බැංකු තිරසාරභාවය ඇගයීමේ දර්ශකය (BSRI) ක්‍රියාත්මක කිරීම |
| | - | ආයතනික යහපාලනය යටතේ වන යෝග්‍යතා පරීක්ෂණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම |
| | - | බලපත්‍රලාභී බැංකු සඳහා කොටස් හිමිකාරිත්වය පිළිබඳ නව ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම |
| | - | බලපත්‍රලාභී බැංකු සඳහා ප්‍රතිසාධන සැලසුම් ක්‍රියාත්මක කිරීම |
| | - | සුදුසුකම්ලත් විගණකවරුන්ගේ ලැයිස්තුව සංශෝධනය කිරීම |
| | - | පද්ධතිමය වශයෙන් වැදගත් දේශීය බැංකු හඳුනා ගැනීම සඳහා රාමුවක් සකස් කිරීම |
| | - | විශාල විදේශීය බැංකු පරිපාලිත සමාගම්කරණය සඳහා රාමුවක් සකස් කිරීම |
| | - | ඒකාබද්ධ අධීක්ෂණය සඳහා රාමුවක් සැකසීම |
| | - | සයිබර් සුරක්ෂිතතාවය සහ බැංකු මෙහෙයුම් කටයුතු ඩිජිටල්කරණය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති රාමුවක් පිහිටුවීම |
| | - | බැංකු ක්ෂේත්‍රයේ තිරසාර මූල්‍යකරණය සඳහා පහසුකම් සැලසීම |

**බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්**

| | | |
|---|---|---|
| 2018 ජනවාරි 16 | - | මුදල් ව්‍යාපාර පනත යටතේ 2018 අංක 01 දරන මූල්‍ය ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීමේ නියාමන රාමුව සම්බන්ධ විධානය නිකුත් කරන ලදී. මෙම විධානයම විශේෂිත කල්බදු මූල්‍යකරණ ආයතන වෙත 2018 ජනවාරි 22 දින නිකුත් කරන ලදී. |
| 2018 මාර්තු 05 | - | 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පී එල් සී වෙත නිකුත් කර තිබූ බලපත්‍රය අවලංගු කළ අතර, එය ඈවර කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. |
| 2018 මාර්තු 13 | - | සියළුම බලපත්‍රලාභී මුදල් සමාගම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළිගනු ලබන ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනයකින් ණය ශ්‍රේණිගත කිරීමක් ලබා ගත යුතු බව සහ එම ශ්‍රේණිගත කිරීම 2018 ඔක්තෝබර් 01 දින සිට බලපවැත්වෙන පරිදි ප්‍රකාශයට පත් කළ යුතු බව දැනුම් දෙන ලදී. |
| 2018 ජූනි 06 | - | බලපත්‍රලාභී මුදල් සමාගම්වල සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල අවදානම් කළමනාකරණය කෙරෙහි අවධානය ඇඩි කරමින් අවදානම තක්සේරු කිරීමේ හැකියාව වර්ධනය කිරීම දිරිමත් කිරීම අරමුණු කරගෙන බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා නව ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා රාමුවක් හඳුන්වා දෙන ලදී. |
| | - | බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් අනුගමනය කරන නිශ්චල දේපල තක්සේරු කිරීමේ ක්‍රමවේදය නියාමනය කිරීම සඳහා විධාන නිකුත් කරන ලදී. |
| 2018 ජූලි 25 | - | 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ ද ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ් වෙත නිකුත් කර තිබූ බලපත්‍රය අවලංගු කළ අතර, එය ඈවර කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. |
| 2018 සැප්තැම්බර් 04 | - | බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් බාහිර පාර්ශවයන්ගෙන් සේවා ලබා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග ක්‍රමවත් කිරීම සඳහා ව්‍යාපාර මෙහෙයුම් සඳහා බාහිර සේවා ලබා ගැනීම සඳහා සම්බන්ධ විධාන නිකුත් කරන ලදී. |
| 2018 ඔක්තෝබර් 01 | - | 2018 ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි විද්‍යුත්, දෙමුහුන් සහ අනෙකුත් ලියාපදිංචි නොකළ මෝටර් වාහන සහ පළමු ලියාපදිංචියෙන් පසු වසරකට වඩා අඩු කාලයක් ශ්‍රී ලංකාව තුළ භාවිතා කරන ලද ලියාපදිංචි වාහන සඳහා ලබා දෙන ණය පහසුකම්වලට පනවා ඇති වටිනාකම මත ණය අනුපාත සංශෝධනය කරමින් බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත විධාන නිකුත් කරන ලදී. මෙම විධානය ප්‍රථමයෙන් 2018 පෙබරවාරි 08 දින නිකුත් කළ අතර, පසුව 2018 ඔක්තෝබර් 01 දින සංශෝධනය වීමට පෙර 2018 ජූනි 07 දින සහ 2018 අගෝස්තු 24 දින සංශෝධනය කරන ලදී. මෙම විධානයට අනුව, දෙමුහුන් මෝටර් රථ, වෑන් රථ සහ SUV රථ සඳහා වටිනාකම් මත ණය අනුපාතය සියයට 50 දක්වා අඩු කරන ලදී. |

| | | |
|---|---|---|
| 2018 දෙසැම්බර් 03 | - | ණය ලබා දීමේදී අසාධාරණ පොලී අනුපාත අය කිරීමෙන් ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ණය සඳහා උපරිම පොලී අනුපාතයක් හඳුන්වා දීම සඳහා විධානයක් නිකුත් කරන ලදී. |
| අපේක්ෂිත | - | හිමිකම් සීමා, ද්‍රවශීලතා කළමනාකරණය, ආයතනික යහපාලනය සහ වෙන් කිරීම් අවශ්‍යතා යනාදී අංශ සම්බන්ධයෙන් විධාන නිකුත් කිරීම |
| | - | බලපත්‍රලාභී මුදල් සමාගම්වල යෝජිත නියාමන හා බලගැන්වීම් රාමුව හා සමගාමීව “මුදල් සමාගමක් ගණන් බේරා වසා දැමීමේදී හිමිකම්පෑම්වල ප්‍රමුඛත්වය” සම්බන්ධ රෙගුලාසි නිකුත් කිරීම |

**රක්ෂණය**

| | | |
|---|---|---|
| 2018 ජනවාරි 09 | - | මුදල් අක්‍රමිකතා හෝ වංචා හේතු කොටගෙන මීට පෙර සේවය අත්හිටවූ පුද්ගලයන් රක්ෂණ අංශයේ සේවයේ යෙදවීමෙන් වැළකී සිටීමේ විධානයක් ශ්‍රී ලංකා රක්ෂණ නියමාන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලදී. |
| 2018 පෙබරවාරි 16 | - | සියලුම දිගුකාලීන රක්ෂණ සමාගම් වෙත රක්ෂණ අරමුදල් කළමනාකරණය පිළිබඳ ක්‍රියාපටිපාටි ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලදී. |
| 2018 මාර්තු 20 | - | එක් වරක් පමණක් ඇති වූ අතිරික්ත හඳුනාගැනීම හා ඒවා ගිණුම්ගත කිරීමේ ක්‍රියා පටිපාටිය පිළිබඳ විධානයක් රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් සියලුම දිගුකාලීන රක්ෂණ සමාගම් වෙත නිකුත් කරන ලදී. |
| 2018 මැයි 01 | - | රක්ෂණ තැරැව්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තුව ඉහළ නංවන ලදී. |
| 2018 මැයි 24 | - | බලපත්‍රලාභී මුදල් සමාගම්, කල්බදු සමාගම් සහ බලපත්‍රලාභී බැංකු හරහා රක්ෂණ පහසුකම් ලබා දීමට පාරිභෝගිකයන් යොමු කර ගන්නා රක්ෂණකරුවන් හා තැරැව්කරුවන් සඳහා මාර්ගෝපදේශ, රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලදී. |
| 2019 ජනවාරි 01 | - | රක්ෂණ ව්‍යාපාර පවත්වාගෙන යෑමේදී විනිවිදභාවය සහතික කිරීම සඳහා රක්ෂණ සමාගම් සඳහා ආයතනික යහපාලනයන් පිළිබඳ විධානයක් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලදී. |
| අපේක්ෂිත | - | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ලෝක බැංකුවේ තාක්ෂණික සහාය ලබා ගැනීම තුළින් මූල්‍ය අංශයේ නවීකරණ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වන නීතිමය හා නියාමන ප්‍රතිසංස්කරණ සිදු කරනු ඇත |

## ප්‍රාග්ධන වෙළඳපොළ

| | | |
|---|---|---|
| 2018 ජනවාරි | - | ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් සියළු ලැයිස්තුගත සමාගම් සඳහා අවම මහජන හිමිකම් අවශ්‍යතා (Minimum Public Holding Requirement) කොන්දේසි බලාත්මක කරන ලදී. |
| 2018 ජූනි | - | ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිසම, 2017 නොවැම්බර් මාසයේදී ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද සුරැකුම් හා විනිමය පනතේ කෙටුම්පත සඳහා ලැබුණු ප්‍රතිචාර සහ කොටස්කරුවන්ගේ අදහස් සමාලෝචනය සඳහා අන්තර් අංශ කමිටුවක් පත් කරන ලදී. |
| 2018 ජූලි | - | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට කොළඹ කොටස් හුවමාරුව හරහා තම ප්‍රාග්ධනය ඉහළ නංවා ගැනීමට පහසුකම් සැලසීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක පුවරුවක් ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් ස්ථාපනය කරන ලදී. |
| 2018 අගෝස්තු | - | ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත හෝ ලියාපදිංචි ආයතන සඳහා යථායෝග්‍යතාව පිළිබඳ මාර්ගෝපදේශ නිකුත් කරන ලදී. |
| 2018 සැප්තැම්බර් | - | කොටස් තැරැව්කාර සමාගම් සඳහා මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීමට සිදු කරන අවධානම පදනම් කරගත් අධීක්ෂණ ක්‍රියාවලියේ ඵලදායීතාවය වැඩි දියුණු කිරීමේ ක්‍රමවේදයක් ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිසම මගින් සකස් කරන ලදී. |

| | | |
|---|---|---|
| 2018 දෙසැම්බර් | - | තමන්ගේම ගිණුමේ ලැයිස්තුගත කොටස් හා ණය සුරැකුම්පත් ආයෝජනය කරන හෝ බැහැර කරන ඒකක භාර කළමනාකරණ සමාගම් සඳහා රාමුවක් ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිසම විසින් හඳුන්වා දෙන ලදී. |
| | - | ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිසම විසින් බහු ව්‍යවහාර මුදලින් නාමනය කරන ලද ව්‍යාපාර වස්තු දැක්වෙන පුවරුවක් ස්ථාපිත කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති අනුමත කරන ලදී. |
| අපේක්ෂිත | - | ප්‍රධාන විධායක නිලධාරියා සහ සභාපතිවරයාගේ කාර්යභාරය වෙන් වෙන්ව හඳුනාගෙන ආයතනික යහපාලන රාමුව වැඩි දියුණු කිරීම |
| | - | ආයතනික යහපාලනය පිළිබඳ ලැයිස්තුගත නීති රීති ඉදිරිපත් කිරීම සහ ගනුදෙනු කිරීම සඳහා සංවෘත කාලයක් (closed period) යෝජනා කිරීම |
| | - | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් නිකුත් කරන ණය සුරැකුම්පත්, කොටස් වෙළඳපොළෙහි ඇති බලගැන්වීම පුවරුවෙහි (Empower Board) ලැයිස්තුගත කිරීම සඳහා ප්‍රතිපත්ති ඉදිරිපත් කිරීම |

## සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය

| | | |
|---|---|---|
| 2018 ජනවාරි 04 | - | ශ්‍රී ලංකාව සඳහා මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගයක් සකස් කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාව සමග සහයෝගිතා ගිවිසුමක් අත්සන් කරන ලදී. |
| 2018 මාර්තු 12 | - | කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල විසින් අරමුදල් සපයනු ලබන කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා රජය සමග පරිපාලන ගිවිසුමක් අත්සන් කරන ලදී. |
| 2018 අප්‍රේල් 10 | - | කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන යටතේ නව ණය යෝජනා ක්‍රම හයක් හඳුන්වාදීම සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී. |
| 2018 ජූලි 15 | - | දිළිඳුකම පිටුදැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ණය ව්‍යාපෘතිය අදියර II - චක්‍රීය අරමුදල අවසන් කරන ලදී. |
| 2018 සැප්තැම්බර් 07 | - | කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා රජය සමග පරිශිෂ්ටයන් සහිත පරිපාලන ගිවිසුම අත්සන් කරන ලදී. |
| 2018 ඔක්තෝබර් 31 | - | ණය යෝජනා ක්‍රමවල මෙහෙයුම් ක්‍රියාවලිය ස්වයංක්‍රීය කිරීම සඳහා වන පද්ධතියක් වැඩිදියුණු කිරීමට කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහනෙහි ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. |
| 2018 දෙසැම්බර් 05 | - | කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන කාලීන ණය යෝජනා ක්‍රමවල ණය ආපසු ගෙවීම් කාල සීමාව සහ ණය සහන කාලය ඉහළ නංවමින් සංශෝධනය කරන ලද මෙහෙයුම් උපදෙස් සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත නිකුත් කරන ලදී. |

## ගෙවීම් හා පියවීම්

| | | |
|---|---|---|
| 2018 ජනවාරි 18 | - | ගෙවීම් සේවා සැලසීම සඳහා මූල්‍ය ආයතන විසින් භාවිත කරනු ලබන ජංගම යෙදුම් මෘදුකාංගවල අවම අනුකූලතා ප්‍රමිතීන් නියම කිරීම සඳහා ගෙවීම් පහසුකම් ලබා දෙන ජංගම යෙදුම් මෘදුකාංගයන්ට අදාළ අවම අනුකූලතා ප්‍රමිතීන් සඳහා වූ මාර්ගෝපදේශ නිකුත් කරන ලදී. |
| | - | සේවා සැපයුම්කරුවන් මගින් ගෙවීම් කාඩ්පත් ගනුදෙනු අත්පත් කර ගැනීමට අදාළ කොන්දේසි නියම කිරීම සඳහා ගෙවීම් කාඩ්පත් මගින් සිදු කරන විද්‍යුත් වාණිජ ගනුදෙනු අත්පත් කර ගැනීම සඳහා වූ විධිවිධානය නිකුත් කරන ලදී. |
| 2018 ජූලි 25 | - | විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය හරහා සිදුකරන ගනුදෙනු පියවීමට ඇති නිෂ්කාශන චක්‍ර ගණන වැඩි කිරීම සඳහා 2014 අංක 02 දරන විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු සඳහා වූ පොදු විධිවිධානය ප්‍රතිස්ථාපනය කරමින් 2018 අංක 01 දරන විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු සඳහා වූ පොදු විධිවිධානය නිකුත් කරන ලදී. |

| | | |
|---|---|---|
| 2018 අගෝස්තු 24 | - | තම ගණුදෙනුකරුවෙකු නොවන කාඩ්පත් හිමියකුගේ විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර ගනුදෙනු හුවමාරුවට සහ නිෂ්කාශනයට පහසුකම් සැලසීම සඳහා තම සාමාජිකයින්ගේ විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සම්බන්ධ කිරීම සඳහා ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් මෙහෙයවනු ලබන විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර පිළිබඳ පොදු යාන්ත්‍රණයෙහි සුමට ක්‍රියාකාරිත්වය තහවුරු කිරීම සඳහා 2018 අංක 02 දරන විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර පිළිබඳ පොදු යාන්ත්‍රණයෙහි මෙහෙයුම් කටයුතු පිළිබඳ පොදු විධිවිධානය නිකුත් කරන ලදී. |
| 2018 ඔක්තෝබර් 09 | - | දේශීය මුදල් ගෙවීම් සඳහා ජාතික QR කේත ප්‍රමිතියක් පිහිටුවීම සඳහා 2018 අංක 06 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛය නිකුත් කරන ලදී. |
| 2018 ඔක්තෝබර් 22 | - | 'ලංකාපේ' ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සහ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි වගකීම් කළමනාකරණ සීමා හඳුන්වා දීම සඳහා 2018 අංක 07 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛය නිකුත් කරන ලදී. |
| අපේක්ෂිත | - | විද්‍යුත් ගෙවීම් උපකරණ මගින් ගනුදෙනු සිදු කිරීම සඳහා පහසුකම් සලසන මූල්‍ය ආයතනවලට එවැනි ගෙවීම් උපකරණ මගින් සිදු කරන ගනුදෙනු සඳහා තත්කාලීන දැනුම් දීමක් සිදු කිරීමට උපදෙස් දීම සඳහා චක්‍රලේඛයක් නිකුත් කිරීමට අපේක්ෂා කරයි. |

## මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම

| | | |
|---|---|---|
| 2018 ජනවාරි 10 | - | අංක 2053/20 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් අවදානම මත පදනම්ව ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීම සඳහා "2018 අංක 1 දරන නාමෝද්දිෂ්ට මූල්‍ය නොවන ව්‍යාපාර (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීති", නාමෝද්දිෂ්ට මූල්‍ය නොවන ව්‍යාපාර වෙත නිකුත් කරන ලදී. |
| 2018 ජනවාරි 11 | - | 2018 අංක 1 දරන මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම කළමනාකරණය කිරීම පිළිබඳ මූල්‍ය ආයතන වෙත ලබාදෙන මාර්ගෝපදේශ නිකුත් කරන ලදී. |
| 2018 අප්‍රේල් 18 | - | 2018 අංක 2 දරන මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා වන අනුකූලතාව සම්බන්ධයෙන් කැසිනෝ සහ සූදු ගෙවල් සඳහා වන මාර්ගෝපදේශ නිකුත් කරන ලදී. |
| | - | 2018 අංක 3 දරන මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා වන අනුකූලතාවය සම්බන්ධයෙන්, නිශ්චල දේපළ අනුයෝජිතයන්, වටිනා ලෝහ වෙළඳුන් සහ මැණික් ගල් හා අඩ මැණික් ගල් වෙළඳුන් වෙත මාර්ගෝපදේශ නිකුත් කරන ලදී. |
| 2018 අප්‍රේල් 19 | - | 2018 අංක 4 දරන ප්‍රතිලාභී හිමිකාරිත්වය හඳුනා ගැනීම සම්බන්ධයෙන් මූල්‍ය ආයතන සඳහා වන මාර්ගෝපදේශ නිකුත් කරන ලදී. |
| 2018 අප්‍රේල් 26 | - | 2015 අන්‍යෝන්‍ය ඇගයීම් වාර්තාවෙහි හඳුනාගත් අඩුපාඩු නිවැරදි කිරීම උදෙසා මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ක්‍රියාවලිය ශක්තිමත් කරමින් එතැන් පරීක්ෂා සඳහා අවදානම මත පදනම් වූ එතැන් පරීක්ෂණ මෙහෙයවීමේ ක්‍රියාපටිපාටිය 2018 අංක 1 දරන චක්‍රලේඛය මඟින් නිකුත් කරන ලදී. |
| 2018 මැයි 18 | - | එක්සත් ජාතීන්ගේ (කොරියානු ප්‍රජාතන්ත්‍රවාදී මහජන සමූහාණ්ඩුව සඳහා වන සම්බාධක පිළිබඳ) නියෝග - 2017, ක්‍රියාත්මක කිරීම සඳහා වන 2018 අංක 5 දරන මාර්ගෝපදේශ, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතෙහි 33 වන වගන්තියෙහි අර්ථ නිරූපණය කර ඇති පරිදි "මූල්‍ය ආයතන" සහ "නාමෝද්දිෂ්ට මූල්‍ය නොවන ව්‍යාපාර" වෙත නිකුත් කරන ලදී. |
| 2018 ජූලි 17 | - | 2018 අංක 1 දරන එක්සත් ජාතීන්ගේ (ඉරානයට අදාළව සම්බාධක පැනවීමේ) නියෝග විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් 2018 ජූලි 17 දිනැති අංක 2080/34 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් මූල්‍ය ආයතන සහ නමෝද්දිෂ්ට මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් වෙත නිකුත් කරන ලදී. |
| 2018 අගෝස්තු 06 | - | 2018 අංක 6 දරන සැක කටයුතු ගනුදෙනු වාර්තා කිරීම සඳහා වන මාර්ගෝපදේශ, මූල්‍ය ආයතන වෙත නිකුත් කරන ලදී. |

| | | |
|---|---|---|
| 2018 සැප්තැම්බර් 07 | - | ප්‍රතිලාභී හිමිකාරිත්වය සම්බන්ධ තොරතුරු භාවිතයෙන් නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන සඳහා වන මාර්ගෝපදේශන සටහන, නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන වෙත නිකුත් කරන ලදී. |
| 2018 සැප්තැම්බර් 10 | - | 2018 අංක 1 දරන එක්සත් ජාතීන්ගේ (ඉරානය සඳහා වන සම්බාධක පිළිබඳ) නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා 2018 අංක 7 දරන මාර්ගෝපදේශ, මූල්‍ය ආයතන සහ නමෝද්දිෂ්ට මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් වෙත නිකුත් කරන ලදී. |
| 2018 ඔක්තෝබර් 08 | - | ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීම සඳහා වන 2016 අංක 1 දරන රීති සංශෝධනය සඳහා අංක 2092/02 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මූල්‍ය ආයතනවෙත නිකුත් කරන ලදී. |

### විදේශ විනිමය කළමනාකරණය

| | | |
|---|---|---|
| 2018 මැයි 02 | - | බලපත්‍රලාභී බැංකුවල විදේශ විනිමය කටයුතුවලට අදාළ වන ශුද්ධ විවෘත විදේශ විනිමය ප්‍රමාණය මත පනවන ලද සීමා සංශෝධනය කරන ලදී. |
| 2018 සැප්තැම්බර් 29 | - | පාර්ලිමේන්තු සභිකයන් සඳහා වාහන අවසරපත් නිකුත් කිරීම වසරක කාලපරිච්ඡේදයක් සඳහා අත්හිටුවන ලදී. |
| | - | රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථාපිත මණ්ඩල සහ රජය සතු ව්‍යවසායයන් සඳහා වාහන මිලදී ගැනීම නැවත දැනුම් දෙන තුරු අත්හිටුවන ලදී. |
| | - | රාජ්‍ය අංශයේ සුදුසුකම්ලත් සේවකයන් සඳහා සහනදායී අවසරපත් භාවිතා කරමින් වාහන ආනයනය කිරීම සඳහා ණයවර ලිපි විවෘත කිරීම මාස හයක කාලපරිච්ඡේදයක් සඳහා අත්හිටුවන බව නිවේදනය කරන ලදී. |
| 2018 ඔක්තෝබර් 05 | - | බලපත්‍රලාභී බැංකුවල විදේශ විනිමය කටයුතුවලට අදාළ වන ශුද්ධ විවෘත විදේශ විනිමය ප්‍රමාණය මත පනවන ලද සීමා සංශෝධනය කරන ලදී. |
| 2018 ඔක්තෝබර් 10 | - | පෙර ගෙවීම්, ගෙවීම් ක්‍රමය යටතේ ශ්‍රී ලංකා රුපියල් වෙනත් විදේශ මුදල් වර්ගයකට පරිවර්තනය කිරීම අවශ්‍ය වන ගෙවීම් සහිත අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය කිරීම සඳහා විදේශ විනිමය නිකුත් කිරීම නැවත දැනුම් දෙන තුරු සීමා කරමින් බලයලත් වෙළඳුන් සඳහා 2018 අංක 01 දරණ විධාන නිකුත් කරන ලදී. |
| 2018 දෙසැම්බර් 21 | - | විදේශීය ආයතනික ආයෝජකයන් සිදුකරන ආයෝජන සම්බන්ධ ගනුදෙනු වෙනුවෙන් තවදුරටත් පහසුකම් සැපයීමේ අරමුණින් යුතුව බලයලත් වෙළඳුන් සඳහා විධාන නිකුත් කරන ලදී. |

### මිල සංශෝධන

| | | |
|---|---|---|
| 2018 අප්‍රේල් 28 | - | කිලෝග්‍රෑම් 12.5 ගෘහස්ත එල්.පී. ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 1,676 දක්වා රුපියල් 245 කින් වැඩි කරන ලදී. |
| 2018 මැයි 11 | - | ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදනවල සිල්ලර මිල ගණන් පහත පරිදි ඉහළ නංවන ලදී.<br>- පෙට්‍රල් (92 ඔක්ටේන්) ලීටරයක මිල රුපියල් 137 දක්වා රුපියල් 20 කින්<br>- පෙට්‍රල් (95 ඔක්ටේන්) ලීටරයක මිල රුපියල් 148 දක්වා රුපියල් 20 කින්<br>- සුදු (ඔටෝ) ඩීසල් ලීටරයක මිල රුපියල් 109 දක්වා රුපියල් 14 කින්<br>- සුපිරි (සුපර්) ඩීසල් ලීටරයක මිල රුපියල් 119 දක්වා රුපියල් 9 කින්<br>- භූමිතෙල් ලීටරයක මිල රුපියල් 101 දක්වා රුපියල් 57 කින් |
| 2018 මැයි 23 | - | මගී බස් ගාස්තු සියයට 12.5 ක ප්‍රතිශතයකින් වැඩි කරන ලදී. අවම බස් ගාස්තුව රුපියල් 10 සිට රුපියල් 12 දක්වා වැඩි කරන ලදී. |
| 2018 ජූනි 13 | - | භූමිතෙල් ලීටරයක සිල්ලර මිල රුපියල් 70 දක්වා රුපියල් 31 කින් අඩු කරන ලදී. |

| | | |
|---|---|---|
| 2018 ජූනි 30 | - | කිලෝග්‍රෑම් 12.5 ගෘහස්ත එල්.පී. ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 1,538 දක්වා රුපියල් 138 කින් අඩු කරන ලදී. |
| 2018 ජූලි 11 | - | ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදනවල සිල්ලර මිල ගණන් පහත පරිදි ඉහළ නංවන ලදී.<br>- පෙට්‍රල් (92 ඔක්ටේන්) ලීටරයක මිල රුපියල් 145 දක්වා රුපියල් 8 කින්<br>- පෙට්‍රල් (95 ඔක්ටේන්) ලීටරයක මිල රුපියල් 155 දක්වා රුපියල් 7 කින්<br>- සුදු ඩීසල් ලීටරයක මිල රුපියල් 118 දක්වා රුපියල් 9 කින්<br>- සුපිරි ඩීසල් ලීටරයක මිල රුපියල් 129 දක්වා රුපියල් 10 කින් |
| 2018 අගෝස්තු 11 | - | ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදනවල සිල්ලර මිල ගණන් පහත පරිදි ඉහළ නංවන ලදී.<br>- පෙට්‍රල් (95 ඔක්ටේන්) ලීටරයක මිල රුපියල් 157 දක්වා රුපියල් 2 කින්<br>- සුපිරි ඩීසල් ලීටරයක මිල රුපියල් 130 දක්වා රුපියල් 1 කින් |
| 2018 සැප්තැම්බර් 11 | - | ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදනවල සිල්ලර මිල ගණන් පහත පරිදි ඉහළ නංවන ලදී.<br>- පෙට්‍රල් (92 ඔක්ටේන්) ලීටරයක මිල රුපියල් 149 දක්වා රුපියල් 4 කින්<br>- පෙට්‍රල් (95 ඔක්ටේන්) ලීටරයක මිල රුපියල් 161 දක්වා රුපියල් 4 කින්<br>- සුදු ඩීසල් ලීටරයක මිල රුපියල් 123 දක්වා රුපියල් 5 කින්<br>- සුපිරි ඩීසල් ලීටරයක මිල රුපියල් 133 දක්වා රුපියල් 3 කින් |
| 2018 සැප්තැම්බර් 21 | - | මගී බස් ගාස්තු සියයට 4 කින් වැඩි කරන ලදී. |
| 2018 සැප්තැම්බර් 27 | - | කිලෝග්‍රෑම් 12.5 ගෘහස්ත එල්.පී. ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 1,733 දක්වා රුපියල් 195 කින් වැඩි කරන ලදී. |
| 2018 ඔක්තෝබර් 01 | - | දුම්රිය ගාස්තු සියයට 15 කින් ඉහළ නංවන ලදී. |
| 2018 ඔක්තෝබර් 11 | - | ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදනවල සිල්ලර මිල ගණන් පහත පරිදි ඉහළ නංවන ලදී.<br>- පෙට්‍රල් (92 ඔක්ටේන්) ලීටරයක මිල රුපියල් 155 දක්වා රුපියල් 6 කින්<br>- පෙට්‍රල් (95 ඔක්ටේන්) ලීටරයක මිල රුපියල් 169 දක්වා රුපියල් 8 කින්<br>- සුපිරි ඩීසල් ලීටරයක මිල රුපියල් 141 දක්වා රුපියල් 8 කින් |
| 2018 ඔක්තෝබර් 12 | - | සුදු සීනි මත පහත පරිදි උපරිම සිල්ලර මිල ගණන් පනවන ලදී.<br>- පැකට් නොකළ සුදු සීනි කිලෝග්‍රෑමයක මිල රුපියල් 100<br>- පැකට් කළ සුදු සීනි කිලෝග්‍රෑමයක මිල රුපියල් 105 |
| 2018 නොවැම්බර් 02 | - | ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදනවල සිල්ලර මිල ගණන් පහත පරිදි අඩු කරන ලදී.<br>- පෙට්‍රල් (92 ඔක්ටේන්) ලීටරයක මිල රුපියල් 145 දක්වා රුපියල් 10 කින්<br>- සුදු ඩීසල් ලීටරයක මිල රුපියල් 116 දක්වා රුපියල් 7 කින් |
| 2018 නොවැම්බර් 09 | - | මගී බස් ගාස්තු සියයට 2 කින් අඩු කරන ලදී. |
| 2018 නොවැම්බර් 16 | - | ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදනවල සිල්ලර මිල ගණන් පහත පරිදි අඩු කරන ලදී.<br>- පෙට්‍රල් (92 ඔක්ටේන්) ලීටරයක මිල රුපියල් 140 දක්වා රුපියල් 5 කින්<br>- පෙට්‍රල් (95 ඔක්ටේන්) ලීටරයක මිල රුපියල් 164 දක්වා රුපියල් 5 කින්<br>- සුදු ඩීසල් ලීටරයක මිල රුපියල් 111 දක්වා රුපියල් 5 කින්<br>- සුපිරි ඩීසල් ලීටරයක මිල රුපියල් 136 දක්වා රුපියල් 5 කින් |

| | | |
|---|---|---|
| 2018 දෙසැම්බර් 01 | - | ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදනවල සිල්ලර මිල ගණන් පහත පරිදි අඩු කරන ලදී.<br>- පෙට්‍රල් (92 ඔක්ටේන්) ලීටරයක මිල රුපියල් 135 දක්වා රුපියල් 5 කින්<br>- පෙට්‍රල් (95 ඔක්ටේන්) ලීටරයක මිල රුපියල් 159 දක්වා රුපියල් 5 කින්<br>- සුදු ඩීසල් ලීටරයක මිල රුපියල් 106 දක්වා රුපියල් 5 කින්<br>- සුපිරි ඩීසල් ලීටරයක මිල රුපියල් 131 දක්වා රුපියල් 5 කින් |
| 2018 දෙසැම්බර් 22 | - | ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදනවල සිල්ලර මිල ගණන් පහත පරිදි අඩු කරන ලදී.<br>- පෙට්‍රල් (92 ඔක්ටේන්) ලීටරයක මිල රුපියල් 125 දක්වා රුපියල් 10 කින්<br>- පෙට්‍රල් (95 ඔක්ටේන්) ලීටරයක මිල රුපියල් 149 දක්වා රුපියල් 10 කින්<br>- සුදු ඩීසල් ලීටරයක මිල රුපියල් 101 දක්වා රුපියල් 5 කින්<br>- සුපිරි ඩීසල් ලීටරයක මිල රුපියල් 121 දක්වා රුපියල් 10 කින් |
| 2018 දෙසැම්බර් 27 | - | මගී බස් ගාස්තු සියයට 4.2 කින් අඩු කරන ලදී. |
| 2019 ජනවාරි 11 | - | ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදනවල සිල්ලර මිල ගණන් පහත පරිදි අඩු කරන ලදී.<br>- පෙට්‍රල් (92 ඔක්ටේන්) ලීටරයක මිල රුපියල් 123 දක්වා රුපියල් 2 කින්<br>- පෙට්‍රල් (95 ඔක්ටේන්) ලීටරයක මිල රුපියල් 147 දක්වා රුපියල් 2 කින්<br>- සුදු ඩීසල් ලීටරයක මිල රුපියල් 99 දක්වා රුපියල් 2 කින්<br>- සුපිරි ඩීසල් ලීටරයක මිල රුපියල් 118 දක්වා රුපියල් 3 කින් |
| 2019 පෙබරවාරි 12 | - | ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදනවල සිල්ලර මිල ගණන් පහත පරිදි ඉහළ නංවන ලදී.<br>- පෙට්‍රල් (92 ඔක්ටේන්) ලීටරයක මිල රුපියල් 129 දක්වා රුපියල් 6 කින්<br>- පෙට්‍රල් (95 ඔක්ටේන්) ලීටරයක මිල රුපියල් 152 දක්වා රුපියල් 5 කින්<br>- සුදු ඩීසල් ලීටරයක මිල රුපියල් 103 දක්වා රුපියල් 4 කින්<br>- සුපිරි ඩීසල් ලීටරයක මිල රුපියල් 126 දක්වා රුපියල් 8 කින් |
| 2019 මාර්තු 13 | - | ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදනවල සිල්ලර මිල ගණන් පහත පරිදි ඉහළ නංවන ලදී.<br>- පෙට්‍රල් (92 ඔක්ටේන්) ලීටරයක මිල රුපියල් 132 දක්වා රුපියල් 3 කින්<br>- පෙට්‍රල් (95 ඔක්ටේන්) ලීටරයක මිල රුපියල් 159 දක්වා රුපියල් 7 කින්<br>- සුදු ඩීසල් ලීටරයක මිල රුපියල් 104 දක්වා රුපියලකින්<br>- සුපිරි ඩීසල් ලීටරයක මිල රුපියල් 134 දක්වා රුපියල් 8 කින් |

## බදු සංශෝධන

### පුද්ගල ආදායම් බදු

| | | |
|---|---|---|
| 2018 අප්‍රේල් 01 | - | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත අනුව සිදු කරන ලද ප්‍රධාන සංශෝධන පහත දක්වා ඇත.<br>- පුද්ගල ආදායම් බදු සඳහා වන නිදහස රුපියල් 500,000 ලෙස පවත්වා ගන්නා ලදී. |

- සේවා නියුක්තියෙන් ලැබෙන ආදායම සඳහා වාර්ෂික බදු නිදහස් දීමනාව වසරකට රුපියල් 750,000 සිට රුපියල් මිලියන 1.2 දක්වා වැඩි කරන ලදී. (රුපියල් 500,000 ක පුද්ගල ආදායම් බදු නිදහස සහ රුපියල් 700,000 ක සේවා නියුක්ති ආදායම් බදු නිදහස මෙම රුපියල් මිලියන 1.2 ක ඇතුළත් වේ.)
- බදු කාණ්ඩ රුපියල් 500,000 සිට රුපියල් 600,000 දක්වා පුළුල් කරන ලද අතර අනුක්‍රමික බදු ව්‍යුහයන් පහත පරිදි හඳුන්වා දෙන ලදී.

| බදු අය කළ හැකි ආදායම (වර්ෂයකට) | | | |
|---|---|---|---|
| පෙර පනත | බදු අනුපාතය | නව පනත | බදු අනුපාතය |
| පළමු රු. 500,000 | 4% | පළමු රු. 600,000 | 4% |
| රු. 500,001 - රු. 1,000,000 | 8% | රු. 600,001 - රු. 1,200,000 | 8% |
| රු. 1,000,001 - රු. 1,500,000 | 12% | රු. 1,200,001 - රු. 1,800,000 | 12% |
| රු. 1,500,000 ඉක්මවන | 16% | රු. 1,800,001 - රු. 2,400,000 | 16% |
| | | රු. 2,400,001 - රු. 3,000,000 | 20% |
| | | රු. 3,000,000 ඉක්මවන | 24% |

- සියයට 10 ක අනුපාතයක් යටතේ ප්‍රාග්ධන ලාභ මත බද්ද හඳුන්වා දෙන ලදී.

### සංස්ථාපිත ආදායම් බදු

2018 අප්‍රේල් 01 - 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත අනුව සංස්ථාපිත ආදායම් බදු, බදු අනුප්‍රමාණ 3 කට පහත පරිදි සංශෝධනය කරන ලදී.

(අ) සියයට 14 ක අඩු බදු අනුප්‍රමාණය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, භාණ්ඩ හා සේවා අපනයන, කෘෂිකාර්මික ව්‍යවසාය, අධ්‍යාපන සේවා, සංචාරක ප්‍රවර්ධන, තොරතුරු තාක්ෂණ සේවා, පුණ්‍ය ආයතන, සේවක අර්ථසාධක අරමුදල, සේවක භාරකාර අරමුදල සහ විශ්‍රාම අරමුදල්වලින් ලද ලාභ හා ආදායම් මත අදාළ වේ.

(ආ) සම්මත බදු අනුප්‍රමාණය වන සියයට 28, බැංකු හා මූල්‍ය ව්‍යාපාර, රක්ෂණ, කල්බදු සහ ආශ්‍රිත ක්‍රියාකාරකම් ඇතුළුව අනෙකුත් සියලුම අංශවල ලාභ හා ආදායම් මත අය කෙරේ.

(ඇ) ඉහළ බදු අනුප්‍රමාණය වන සියයට 40, ඔට්ටු හා සූදු, මත්පැන් සහ දුම්කොළවලින් ලද ලාභ හා ආදායම් සඳහා අදාළ වේ.

### රඳවා ගැනීමේ බදු

2018 අප්‍රේල් 01 - 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත අනුව පහත සංශෝධන සිදු කරන ලදී.

- බැංකු තැන්පතු මත පුද්ගලයන් විසින් උපයන පොලී ආදායම මත රඳවා ගැනීමේ බදු අනුපාතිකය සියයට 2.5 සිට සියයට 5 දක්වා වැඩි කරන ලදී.
- ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා රුපියල් මිලියන 1.5 දක්වා බැංකු තැන්පතු මත උපයන පොලී ආදායම මත රඳවා ගැනීමේ බදු නිදහස් කරන ලදී.
- භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර පොලී ආදායම මත රඳවා ගැනීමේ බදු නිදහස් කරන ලදී.
- මසකට රුපියල් 50,000 ක් ඉක්මවන සේවා ගාස්තු සහ කොන්ත්‍රාත් ගෙවීම් සඳහා රඳවා ගැනීමේ බද්දක් පනවන ලදී.

| | | |
|---|---|---|
| අපේක්ෂිත | - | ඕනෑම නේවාසික පුද්ගලයෙකුට කරනු ලබන මසකට රු. 50,000 ක් නොඉක්මවන රාජ්‍යභාග ගෙවීම්, තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් 500,000 ක උපරිමයකට යටත්ව රඳවා ගැනීමේ බද්දෙන් නිදහස් කිරීම |
| | - | ඕනෑම නේවාසික පුද්ගලයෙකුට කරනු ලබන මසකට රු. 50,000 ක් නොඉක්මවන කුලී ගෙවීම්, තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් 500,000 ක උපරිමයකට යටත්ව රඳවා ගැනීමේ බද්දෙන් නිදහස් කිරීම |

## ආර්ථික සේවා ගාස්තුව

| | | |
|---|---|---|
| අපේක්ෂිත | - | භාණ්ඩ හෝ සේවා අපනයනය කිරීමේදී, පිරිවැටුම මත අය කරන ආර්ථික සේවා ගාස්තුව සියයට 0.50 සිට සියයට 0.25 දක්වා අඩු කිරීම |
| | - | රටට ඇති වන ආර්ථික ප්‍රතිලාභය සැලකිල්ලට ගෙන මුදල් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ප්‍රාග්ධන භාණ්ඩ හැර ඕනෑම භාණ්ඩයක් හෝ උපාංගයක් ආනයනය මත සියයට 0.5 ක ආර්ථික සේවා ගාස්තුවක් පැනවීම |

## ආදායම් බදු නිදහස් කිරීම්[2]

| | | |
|---|---|---|
| අපේක්ෂිත | - | දේශීය හෝ විදේශීය ව්‍යවහාර මුදලින් වන ස්වෛරීත්ව බැඳුම්කර මත යම් අනේවාසික තැනැත්තෙකුගේ ආදායම |
| | - | ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරද ඇතුළත්ව විදේශීය ව්‍යවහාර මුදලින් වන ස්වෛරීත්ව බැඳුම්කර මත යම් නේවාසික තැනැත්තෙකු විසින් උපයනු ලබන පොලී ආදායම |
| | - | අනේවාසික විදේශීය ව්‍යවහාර ගිණුම් හෝ නේවාසික විදේශීය ව්‍යවහාර ගිණුම් මත ඕනෑම පුද්ගලයෙකු විසින් උපයනු ලබන පොලී ආදායම (වසර 05 ක කාලයක් සඳහා) |
| | - | මූල්‍ය ආයතනයක පවත්වාගෙන යනු ලබන තැන්පතු ගිණුම් මත වයස අවුරුදු 18 ට අඩු ළමුන් විසින් උපයනු ලබන මසකට රුපියල් 5,000 ක් දක්වා වන පොලී ආදායම |
| | - | ශ්‍රී ලංකාවේ යම් තැනැත්තෙකුට සපයන ලද ණය මුදල් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තෙකුට ගෙවන පොලිය (අනේවාසික සමාගමක් විසින් සිය පාලක හෝ පාලිත සමාගමක් වෙත ලබා දෙන ණය මුදල් සඳහා අදාළ නොවේ.) |

2 ආදායම් බදු නිදහස් කිරීම් පුද්ගල ආදායම් බදු සහ සංස්ථාපිත ආදායම් බදු යන දෙකටම අදාළ වේ.

## ඉහළ වටිනාකමකින් යුතු දේශීය ආයෝජන සහ විදේශ ඍජු ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා වන ආයෝජන දිරිගැන්වීම

අපේක්ෂිත - පහත පරිදි මහා පරිමාණ ව්‍යාපෘති සඳහා දිරිදීමනා ලබා දීම.

| බදු ප්‍රතිපත්තිය | ආයෝජනයේ ප්‍රමාණය | | |
|---|---|---|---|
| | එ.ජ.ඩො. බිලියන 1 ට වැඩි | එ.ජ.ඩො. මිලියන 100 ට වැඩි | එ.ජ.ඩො. මිලියන 50 ට වැඩි |
| ආයෝජනයේ වටිනාකමින් සියයට 150 ක් දක්වා වන ප්‍රාග්ධන දීමනා | සියයට 150 ක් සහ අවුරුදු 25 ක් | සියයට 150 ක් සහ අවුරුදු 10 ක් | සියයට 100 ක් සහ අවුරුදු 10 ක් |
| ව්‍යාපෘති ආරම්භ කිරීමේදී අදාළ වන බදු | ජාතිය ගොඩනැගීමේ බද්ද : නිදහස්<br>වරාය හා ගුවන්තොටුපළ සංවර්ධන බද්ද : නිදහස්<br>සෙස් බද්ද : නිදහස්<br>තහනම් ලැයිස්තුවේ සඳහන් භාණ්ඩ මත බදු සහ අනෙකුත් අය බදු : තහනම් ලැයිස්තුව අදාළ නොවේ. | | |
| ආයතනය විසින් අනේවාසිකයන්ට ගෙවනු ලබන ලාභාංශ බදු | ශුන්‍ය | අදාළ නොවේ | අදාළ නොවේ |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ සේවා නියුක්ති ආදායම මත වන රඳවා ගැනීමේ බද්ද | නිදහස් | අදාළ නොවේ | අදාළ නොවේ |

## එකතු කළ අගය මත බදු

2018 ජූලි 02 - රෝහල් කාමර ගාස්තුව හැර ඕනෑම සෞඛ්‍ය සේවාවක් සඳහා වන වියදම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.

2018 නොවැම්බර් 01 - ඉරන ලද දැව මත වන එකතු කළ අගය මත බදු අනුපාතිකය සියයට 15 සිට සියයට 5 දක්වා අඩු කරන ලදී.

- ආනයනික රෙදිපිළි, එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.

අපේක්ෂිත - ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුම්ගත, අපනයනය පදනම් කර ගත් ආයතන විසින් ඇතැම් ඇඟලුම් දේශීයව විකිණීමේදී, ඒකක මත පදනම් කර ගත් එකතු කළ අගය බදු අනුපාතිකය රුපියල් 75 සිට රුපියල් 100 දක්වා ඉහළ නැංවීම

- සහාධිපත්‍ය නිවාස ඒකක විකිණීම මත එකතු කළ අගය මත බදු පැනවීම

## ජාතිය ගොඩනැගීමේ බද්ද

2018 අප්‍රේල් 01 - මත්පැන් ආනයනය කරනු ලබන තැනැත්තා විසින්ම ඒවා විකිණීමේ දී ලබා දී තිබූ ජාතිය ගොඩනැගීමේ බදු අත්හැරීම ඉවත් කරන ලදී.

- මුදල් නීති පනත යටතේ සිදු කරනු ලැබූ නියෝග මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ ක්‍රමය මගින් සපයන ලද සේවා ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කරන ලදී.

| | | |
|---|---|---|
| 2018 ජූලි 30 | - | මත්පැන් ආනයනය සහ මත්පැන් නිෂ්පාදන ව්‍යාපාර මගින් ලැබෙන ආදායම මත වූ ජාතිය ගොඩනැගීමේ බදු නිදහස් කිරීම් ඉවත් කරන ලදී. |
| | - | එයට අමතරව පහත සඳහන් භාණ්ඩ හා සේවා ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කරන ලදී. |
| | | - 2018 අප්‍රේල් 01 දිනෙන් ආරම්භ වන අවුරුදු තුනක කාල පරිච්ඡේදයක් සඳහා දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ලද පොල් කිරි, පොල්තෙල්, පුන්නක්කු, පොල් තීරු, පොල් කටු හෝ පොල් වතුර නිෂ්පාදකයා විසින් අලෙවිකරනු ලබන අවස්ථාවේ දී |
| | | - 2017 අගෝස්තු 01 දිනට පෙර ලියා අත්සන් කරනු ලැබූ කොන්ත්‍රාත් ගිවිසුමක් යටතේ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවෙකු සලසන සේවා |
| | | - කයාක්ස් ඔරු පැදීම, කයිට් සර්ෆින්ග් සහ කිමිදීම ඇතුළු ජල ක්‍රීඩා සඳහා යොදා ගන්නා මෝටර් මගින් ක්‍රියාත්මක නොවන උපකරණ හා උපාංග ආනයනය |
| | | - ආනයනය කරන අවස්ථාවේ දී රේගු කාර්ය සඳහා ශීර්ෂ අංක යටතේ වර්ගීකරණය කරනු ලැබුවා වූ එල්ලී යන ග්ලයිඩර් පැදීම, බැලූන පැදීම, පැදවිය හැකි ගුවන් යානා, පැරෂූට් පැදීම හා පැරාග්ලයිඩර පැදීම ඇතුළු ගුවන් ක්‍රීඩා සඳහා වන බලගැන්වීම් නොමැති උපකරණ හා උපාංග |
| | | - කපා ඔපදමා ප්‍රතිඅපනයනය කිරීමේ කාර්යය සඳහා මැණික් ගල් ආනයනය කිරීම |
| | | - කෘෂිකර්මය විෂයය පවරා ඇති අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරන ලද සහ එකී අයිතමයන් ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය නොකරන ලද බවට වන කොන්දේසියට යටත් ව, හරිතාගාර ඉදිකිරීම සඳහා වන ද්‍රව්‍ය ආනයනය කිරීම සහ හරිතාගාර හා පොලිතීන් හරිතාගාර (poly tunnels) සඳහා වන උපකරණ ආනයනය කිරීම |
| අපේක්ෂිත | - | දුම්වැටි නිෂ්පාදනය මත වන ජාතිය ගොඩනැගීමේ බදු නිදහස ඉවත් කිරීම |
| | - | ප්‍රධාන ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් සඳහා වන ජාතිය ගොඩනැගීමේ බද්ද ඉවත් කිරීම |
| | - | ජාතික ස්වර්ණාභරණ අධිකාරියේ ලියාපදිංචි වූ මැණික් ගල් කැපීමේ සේවාවේ නිරතවන්නන් කපා ඔප දමා ප්‍රති අපනයනය කිරීම සඳහා ආනයනය කරනු ලබන සැකසුම් නොකරන ලද, දළ මැණික් ගල් ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කිරීම |
| | - | විද්‍යුත් මුදල් හුවමාරු කාඩ්පත් (ණයපත් සහ හරපත්) භාවිතා කර, අක්වෙරළ ඩිජිටල් සේවාවන්ද ඇතුළුව භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සඳහා විදේශයන්ට කරනු ලබන ගෙවීම් මත සියයට 3.5 ක ජාතිය ගොඩනැගීමේ බද්දක් පැනවීම සහ ණයපත් භාවිතා කරමින් සිදු කරන විදේශ මිලදී ගැනීම් මත වන සියයට 2.5 ක මුද්දර ගාස්තු ඉවත් කිරීම |
| | - | විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් ලබන සංචාරක හෝටල් ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කිරීම |
| | - | ලූසර්න් (ඇල්ෆල්ෆා) ආහාර සහ තැටි ආනයනය මත වන ජාතිය ගොඩනැගීමේ බද්ද ඉවත් කිරීම |

## නිෂ්පාදන/සුරා බදු

| | | |
|---|---|---|
| 2018 පෙබරවාරි 21 | - | ආනයනය කරනු ලබන පානීය නොවන ස්ප්‍රීතු මත සුරා බද්ද තොග කිලෝග්‍රෑමයට රුපියල් 15 සිට තොග කිලෝග්‍රෑමයට රුපියල් 6 දක්වා අඩු කරන ලදී. |
| 2018 ඔක්තෝබර් 04 | - | ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි අනුමත සමාගම් විසින් ආනයනය කරනු ලබන පානීය නොවන ස්ප්‍රීතු සුරා බදුවලින් නිදහස් කරන ලදී. |

2019 මාර්තු 06 - මධ්‍යසාර පරිමාව පදනම් කරගනිමින් මත්පැන් මත වන සුරා බදු අනුපාතය පහත පරිදි ඉහළ නංවන ලදී.

| වර්ගය | පෙර පැවති බදු අනුපාතය (මධ්‍යසාර ලීටරයට රුපියල්) | වර්තමාන බදු අනුපාතය (මධ්‍යසාර ලීටරයට රුපියල්) |
|---|---|---|
| විශේෂ අරක්කු | 3,300 | 3,300 |
| අනෙකුත් අරක්කු | 3,300 | 3,550 |
| මෙරට නිෂ්පාදිත විශේෂ අරක්කු | 3,300 | 3,550 |
| බියර් සියයට 5 ට අඩු | 2,400 | 2,700 |
| බියර් සියයට 5 ට වැඩි | 2,400 | 2,700 |
| දේශීය වයින් | 100 (තොග ලීටරයකට) | 600 (100% ස්ප්‍රීතු ලීටරයකට) |

- ආනයනික මත්පැන් මත වන සුරා බදු පහත පරිදි ඉහළ නංවන ලදී.
  - මෝල්ට් මත්පැන් (බියර්) මත වන සුරා බද්ද තොග ලීටරයට රුපියල් 50 සිට තොග ලීටරයට රුපියල් 55 දක්වා ඉහළ නංවන ලදී.
  - වයින් සඳහා වන සුරා බද්ද තොග ලීටරයට රුපියල් 100 සිට තොග ලීටරයට රුපියල් 110 දක්වා ඉහළ නංවන ලදී.
  - අනෙකුත් මත්පැන් සඳහා වන සුරා බද්ද තොග ලීටරයට රුපියල් 200 සිට තොග ලීටරයට රුපියල් 215 දක්වා ඉහළ නංවන ලදී.

## නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද

2018 මැයි 31 - භූමිතෙල් වර්ගයේ ජෙට් ඉන්ධන හැර භූමිතෙල් සඳහා ලීටරයට රුපියල් 7 ක නිෂ්පාදන බද්දක් පනවන ලදී.

2018 ජූනි 14 - භූමිතෙල් සඳහා වූ ලීටරයට රුපියල් 7 ක් වූ නිෂ්පාදන බද්ද ඉවත් කරන ලදී.

2018 අගෝස්තු 01 - සිලින්ඩර ධාරිතාව ඝන සෙන්ටිමීටර් 1,000 නොඉක්මවූ මෝටර් වාහන මත නිෂ්පාදන බද්ද එන්ජින් ධාරිතාවයෙන් ඝන සෙන්ටිමීටරයට රුපියල් 1,750 සිට ඒකකයට රුපියල් මිලියන 1.5 හෝ එන්ජින් ධාරිතාවයෙන් ඝන සෙන්ටිමීටරයට රුපියල් 1,750 ක් යන දෙකෙන් වැඩි අගය සඳහා සංශෝධනය කරන ලදී.

- සිලින්ඩර ධාරිතාව ඝන සෙන්ටිමීටර් 1,000 නොඉක්මවූ දෙමුහුන්, පුළිඟු ජ්වලන දෙමුහුන් සහ විද්‍යුත් මෝටර් වාහන මත නිෂ්පාදන බද්ද එන්ජින් ධාරිතාවයෙන් ඝන සෙන්ටිමීටරයට රුපියල් 1,250 සිට ඒකකයට රුපියල් මිලියන 1.25 දක්වා සංශෝධනය කරන ලදී.
- දිග මිලිමීටර් 72 ට වැඩි නමුත් මිලිමීටර් 84 ට නොවැඩි සිගරට් මත වූ නිෂ්පාදන බද්ද සිගරට් 1,000 ට රුපියල් 30,550 සිට සිගරට් 1,000 ට රුපියල් 33,550 දක්වා වැඩි කරන ලදී.
- දිග මිලිමීටර් 84 ට වැඩි සිගරට් මත වූ නිෂ්පාදන බද්ද සිගරට් 1,000 ට රුපියල් 34,250 සිට සිගරට් 1,000 ට රුපියල් 37,675 දක්වා වැඩි කරන ලදී.

2018 නොවැම්බර් 02 - ආනයනික සුදු ඩීසල් මත වූ නිෂ්පාදන බද්ද ලීටරයකට රුපියල් 13 සිට රුපියල් 6 දක්වා අඩු කරන ලදී.

| | | |
|---|---|---|
| 2018 දෙසැම්බර් 03 | - | පැණිරස කරන ලද පාන වර්ග, ශක්තිජනක පාන වර්ග සහ පලතුරු හෝ එළවළු යුෂ පාදක කරගත් පාන වර්ග මත වූ නිෂ්පාදිතයේ අඩංගු සීනි ග්‍රෑමයකට ශත 50 ක නිෂ්පාදන බද්ද, ලීටරයකට රුපියල් 12 ක් හෝ නිෂ්පාදිතයේ අඩංගු සීනි මිලි ලීටර 100 කට ග්‍රෑම් 6 ක් ඉවත් කරමින්, ග්‍රෑමයකට ශත 30 ක් යන දෙකෙන් වැඩි අගය දක්වා සංශෝධනය කරන ලදී. |
| 2019 මාර්තු 06 | - | දුම්වැටි සඳහා වන නිෂ්පාදන බද්ද සියයට 12 කින් ඉහළ නංවන ලදී. |
| | - | පැණි රසකාරක පාන වර්ගවල බදු නිදහස් ප්‍රමාණය ඉක්මවන සීනි ග්‍රෑම් 01 ක් සඳහා වන නිෂ්පාදන බද්ද ශත 30 සිට ශත 40 දක්වා ඉහළ නංවන ලදී.<br>- පාන වර්ගවල අඩංගු බදු නිදහස් සීනි ප්‍රමාණය පහත පරිදි පහත පරිදි අඩු කරන ලදී.<br>- කාබනේට අඩංගු පාන වර්ග සඳහා මිලි ලීටර 100 ට ග්‍රෑම් 6 සිට මිලි ලීටර 100 ට ග්‍රෑම් 4 දක්වා<br>- පලතුරු අඩංගු පාන වර්ග සඳහා මිලි ලීටර 100 ට ග්‍රෑම් 9 සිට මිලි ලීටර 100 ට ග්‍රෑම් 8 දක්වා<br>- පාම් තෙල් මේද අම්ල මත වන නිෂ්පාදන බද්ද පහත පරිදි අඩු කරන ලදී.<br>- පාම් තෙල් මේද අම්ල සඳහා සියයට 25 සිට සියයට 20 දක්වා<br>- ටැලෝ මේද අම්ල සඳහා සියයට 25 සිට සියයට 20 දක්වා |
| | - | ශීතකරණ මත වන නිෂ්පාදන බද්ද සියයට 17 සිට සියයට 25 දක්වා ඉහළ නංවන ලදී. |
| | - | එන්ජිම සහ තැටි සවි කළ චැසි ලෙස ආනයනය කරනු ලබන වාහන මත වන නිෂ්පාදන බද්ද රුපියල් 700,000 සිට රුපියල් 500,000 දක්වා අඩු කරන ලදී. |
| | - | එන්ජින් ධාරිතාවය ඝන සෙන්ටිමීටර 2,000 ට අඩු වාහන සඳහා වන නිෂ්පාදන බද්ද ඉහළ නංවන ලදී. |
| | - | අවමංගල රථ, දෙමුහුන් හා විද්‍යුත් මෝටර් වැන් රථ සහ කැබ් රථ මත වන නිෂ්පාදන බදු අඩු කිරීම. |
| | - | කිලෝග්‍රෑම් 2,000 ට නොවැඩි භාණ්ඩ ප්‍රවාහන ධාරිතාවයක් සහිත කුඩා ලොරි රථවල නිෂ්පාදන බද්ද අඩු කරන ලදී. |

## ආනයන තීරු බදු

| | | |
|---|---|---|
| 2018 අප්‍රේල් 18 | - | රත්‍රන් ආනයනය මත සියයට 15 ක ආනයන බද්දක් පනවන ලදී. |
| 2018 මැයි 03 | - | බීඩි කොළ ආනයනය මත රේගුව විසින් පනවා තිබූ විශේෂිත ආනයන බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 250 සිට කිලෝග්‍රෑමයට රුපියල් 750 දක්වා වැඩි කළ අතර, වටිනාකම මත බදු අනුපාතය සියයට 30 මට්ටමේ නොවෙනස්ව පවතී. |
| | - | බීඩි දුම්කොළ ආනයනය මත පනවා තිබූ සියයට 85 ක වටිනාකම මත බද්දට අතිරේකව කිලෝග්‍රෑමයට රුපියල් 150 ක විශේෂිත තීරු බද්දක් හඳුන්වා දුන් අතර, ඉන් වැඩි අගය මත තීරු මත බදු අය කරනු ඇත. |

| | | |
|---|---|---|
| 2018 මැයි 11 | - | පෙට්‍රල් (92 ඔක්ටේන්) ආනයනය කිරීමේදී පැවති තීරුබදු අත්හැරීම ලීටරයට රුපියල් 23 සිට ලීටරයට රුපියල් 9.58 දක්වා අඩු කරන ලදී. ඒ අනුව, පෙට්‍රල් (92 ඔක්ටේන්) සඳහා අදාළ වන තීරු බදු අනුපාතිකය ලීටරයට රුපියල් 25.42 කි. |
| | - | පෙට්‍රල් (95 ඔක්ටේන්) ආනයනය කිරීමේදී පැවති තීරුබදු අත්හැරීම ලීටරයට රුපියල් 23 සිට ලීටරයට රුපියල් 9.41 දක්වා අඩු කරන ලදී. ඒ අනුව, පෙට්‍රල් (95 ඔක්ටේන්) සඳහා අදාළ වන තීරු බදු අනුපාතිකය ලීටරයට රුපියල් 25.59 කි. |
| | - | සුදු ඩීසල් ආනයනය කිරීමේදී පැවති තීරුබදු අත්හැරීම ලීටරයට රුපියල් 11 සිට ලීටරයට රුපියල් 9.15 දක්වා අඩු කරන ලදී. ඒ අනුව, සුදු ඩීසල් සඳහා අදාළ වන තීරු බදු අනුපාතිකය ලීටරයට රුපියල් 5.85 කි. |
| | - | සුපිරි ඩීසල් ආනයනය කිරීමේදී පැවති තීරුබදු අත්හැරීම ලීටරයට රුපියල් 11 සිට ලීටරයට රුපියල් 4.45 දක්වා අඩු කරන ලදී. ඒ අනුව, සුපිරි ඩීසල් සඳහා අදාළ වන තීරු බදු අනුපාතිකය ලීටරයට රුපියල් 10.55 කි. |
| 2018 මැයි 16 | - | පෙට්‍රල් (92 ඔක්ටේන්) සඳහා වූ ආනයන තීරු බද්ද ලීටරයට රුපියල් 35 සිට ලීටරයට රුපියල් 25.42 දක්වා ද තීරුබදු අත්හැරීම ලීටරයට රුපියල් 9.58 සිට ලීටරයට රුපියල් 7 දක්වා ද අඩු කරන ලදී. ඒ අනුව, පෙට්‍රල් (92 ඔක්ටේන්) සඳහා අදාළ වන තීරු බදු අනුපාතිකය ලීටරයට රුපියල් 18.42 කි. |
| | - | පෙට්‍රල් (95 ඔක්ටේන්) සඳහා වූ ආනයන තීරු බද්ද ලීටරයට රුපියල් 35 සිට ලීටරයට රුපියල් 25.59 දක්වා අඩු කළ අතර, තීරුබදු අත්හැරීම ඉවත් කරන ලදී. |
| | - | සුදු ඩීසල් සඳහා වූ ආනයන තීරු බද්ද ලීටරයට රුපියල් 15 සිට ලීටරයට රුපියල් 5.85 දක්වා ද තීරුබදු අත්හැරීම ලීටරයට රුපියල් 9.15 සිට ලීටරයට රුපියල් 2 දක්වා ද අඩු කරන ලදී. ඒ අනුව, සුදු ඩීසල් සඳහා අදාළ වන තීරු බදු අනුපාතිකය ලීටරයට රුපියල් 3.85 කි. |
| | - | සුපිරි ඩීසල් සඳහා වූ ආනයන තීරු බද්ද ලීටරයට රුපියල් 15 සිට ලීටරයට රුපියල් 10.55 දක්වා අඩු කළ අතර, තීරුබදු අත්හැරීම ඉවත් කරන ලදී. |
| 2018 ජූලි 11 | - | බීඩි කොළ ආනයනය මත රේගුව විසින් පනවා තිබූ විශේෂිත ආනයන බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 750 සිට කිලෝග්‍රෑමයට රුපියල් 250 දක්වා අඩු කළ අතර, වටිනාකම මත බදු අනුපාතය සියයට 30 මට්ටමේ නොවෙනස්ව පවතී. |
| 2018 සැප්තැම්බර් 19 | - | සීනි ආනයනය සඳහා කිලෝග්‍රෑමයට රුපියල් 4 ක තීරුබදු අත්හැරීමක් ලබා දෙන ලදී. ඒ අනුව සීනි සඳහා අදාළ වන තීරු බදු අනුපාතිකය කිලෝග්‍රෑමයට රුපියල් 8 කි. |
| | - | කිරි පිටි ආනයනය සඳහා වූ තීරු බදු අත්හැරීම කිලෝග්‍රෑමයට රුපියල් 223 සිට කිලෝග්‍රෑමයට රුපියල් 175 දක්වා අඩු කරන ලදී. ඒ අනුව, කිරි පිටි සඳහා අදාළ වන තීරු බදු අනුපාතිකය කිලෝග්‍රෑමයට රුපියල් 50 කි. |
| 2018 ඔක්තෝබර් 03 | - | කිරි පිටි ආනයනය සඳහා වූ තීරු බදු අත්හැරීම කිලෝග්‍රෑමයට රුපියල් 175 සිට කිලෝග්‍රෑමයට රුපියල් 223 දක්වා වැඩි කරන ලදී. ඒ අනුව, කිරි පිටි සඳහා අදාළ වන තීරු බදු අනුපාතිකය කිලෝග්‍රෑමයට රුපියල් 2 කි. |
| 2018 ඔක්තෝබර් 17 | - | කිරි පිටි ආනයනය සඳහා වූ තීරු බදු අත්හැරීම කිලෝග්‍රෑමයට රුපියල් 223 සිට කිලෝග්‍රෑමයට රුපියල් 210 දක්වා අඩු කරන ලදී. ඒ අනුව, කිරි පිටි සඳහා අදාළ වන තීරු බදු අනුපාතිකය කිලෝග්‍රෑමයට රුපියල් 15 කි. |
| 2018 නොවැම්බර් 02 | - | පෙට්‍රල් (92 ඔක්ටේන්) ආනයනය කිරීමේදී පැවති තීරුබදු අත්හැරීම ලීටරයට රුපියල් 7 සිට ලීටරයට රුපියල් 13 දක්වා ඉහළ නංවන ලදී. ඒ අනුව, පෙට්‍රල් (92 ඔක්ටේන්) සඳහා අදාළ වන තීරු බදු අනුපාතිකය ලීටරයට රුපියල් 12.42 කි. |
| | - | තිරිඟු ඇට ආනයනය කිරීමේදී පැවති තීරුබදු අත්හැරීම කිලෝග්‍රෑමයට රුපියල් 6 සිට කිලෝග්‍රෑමයට රුපියල් 9 දක්වා ඉහළ නංවන ලදී. ඒ අනුව, තිරිඟු ඇට සඳහා අදාළ වන තීරුබදු අනුපාතිකය කිලෝග්‍රෑමයට රුපියල් 3 කි. |

| | | |
|---|---|---|
| 2018 නොවැම්බර් 16 | - | පෙට්‍රල් (92 ඔක්ටේන්) සඳහා වූ ආනයන තීරු බද්ද ලීටරයට රුපියල් 25.42 සිට ලීටරයට රුපියල් 35 දක්වාද තීරුබදු අත්හැරීම ලීටරයට රුපියල් 13 සිට ලීටරයට රුපියල් 20 දක්වාද ඉහළ නංවන ලදී. ඒ අනුව, පෙට්‍රල් (92 ඔක්ටේන්) සඳහා අදාළ වන තීරු බදු අනුපාතිකය ලීටරයට රුපියල් 15 කි. |
| | - | පෙට්‍රල් (95 ඔක්ටේන්) සඳහා වූ ආනයන තීරු බද්ද ලීටරයට රුපියල් 25.59 සිට ලීටරයට රුපියල් 35 දක්වා ඉහළ නංවන ලද අතර තීරුබදු අත්හැරීම ලීටරයට රුපියල් 9.41 සිට ලීටරයට රුපියල් 3 දක්වා අඩු කරන ලදී. ඒ අනුව, පෙට්‍රල් (95 ඔක්ටේන්) සඳහා අදාළ වන තීරු බදු අනුපාතිකය ලීටරයට රුපියල් 32 කි. |
| 2018 නොවැම්බර් 20 | - | සුදු ඩීසල් ආනයනය සඳහා වූ තීරුබදු අත්හැරීම ලීටරයට රුපියල් 2 සිට ලීටරයට රුපියල් 5 දක්වා ඉහළ නංවන ලදී. ඒ අනුව, සුදු ඩීසල් සඳහා අදාළ වන තීරු බදු අනුපාතිකය ලීටරයට ශත 85 කි. |
| 2018 දෙසැම්බර් 28 | - | පෙට්‍රල් (95 ඔක්ටේන්) ආනයනය සඳහා වූ තීරු බදු අත්හැරීම ඉවත් කරන ලදී. ඒ අනුව, පෙට්‍රල් (95 ඔක්ටේන්) සඳහා අදාළ වන තීරු බදු අනුපාතිකය ලීටරයට රුපියල් 35 කි. |
| 2019 ජනවාරි 12 | - | පෙට්‍රල් (92 ඔක්ටේන්) ආනයනය සඳහා වූ තීරු බදු අත්හැරීම ලීටරයට රුපියල් 20 සිට ලීටරයට රුපියල් 19 දක්වා අඩු කරන ලදී. ඒ අනුව, පෙට්‍රල් (92 ඔක්ටේන්) සඳහා අදාළ වන තීරු බදු අනුපාතිකය ලීටරයට රුපියල් 16 කි. |
| | - | සුදු ඩීසල් ආනයනය සඳහා වූ තීරු බදු අත්හැරීම ලීටරයට රුපියල් 5 සිට ලීටරයට රුපියල් 3 දක්වා අඩු කරන ලදී. ඒ අනුව, සුදු ඩීසල් සඳහා අදාළ වන තීරු බදු අනුපාතිකය ලීටරයට රුපියල් 2.85 කි. |
| 2019 මාර්තු 06 | - | පානීය නොවන එතනෝල් මධ්‍යසාර ලීටරයකට අයකරන තීරු බද්ද ලීටරයට රුපියල් 1,000 දක්වා ලීටරයට රුපියල් 200 කින් වැඩි කරන ලදී. |
| | - | ගෝ-කාර්ට් සහ ගෝ-කාර්ට් ටයර් ආනයනය මත වන සියයට 30 ක තීරු බද්ද ඉවත් කරන ලදී. |
| අපේක්ෂිත | - | ආනයනික පලතුරු බීම මත වන තීරු බද්ද සංශෝධනය කිරීම |

**සෙස් බද්ද**

| | | |
|---|---|---|
| 2018 ජනවාරි 01 | - | රසගැන්වූ හෝ නොගැන්වූ තේ අපනයන මත පනවා තිබූ කිලෝග්‍රෑමයට රුපියල් 10 ක විශේෂිත සෙස් බද්දට අතිරේකව කොළඹ තේ වෙන්දේසියේ සාමාන්‍ය මිලෙන් සියයට 2.5 ක වටිනාකම මත බදු අනුපාතිකයක් හඳුන්වා දෙනු ලැබූ අතර ඉන් වැඩි අගය මත සෙස් බදු අය කරනු ඇත. |
| 2019 මාර්තු 06 | - | බීඩි කොළ සඳහා වන සෙස් බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 2,500 සිට කිලෝග්‍රෑමයට රුපියල් 3,500 දක්වා ඉහළ නංවන ලදී. |
| | - | වියළි පලතුරු, අලුත් හෝ වියළි කජු සහ භාවිතා කරන ලද හෝ අලුත්වැඩියා කරන ලද ශීතකරණ මත වන සෙස් බද්ද අඩු කරන ලදී. |
| | - | මෝටර් වාහන කොටස් සහ කොම්පෝස්ට්කරණය කළ හැකි ප්ලාස්ටික් මත වන සෙස් බද්ද සංශෝධනය කරන ලදී. |
| | - | ආනයනික ඉදිකිරීම් උපකරණ මත වන සෙස් බද්ද සියයට 30 කින් අඩු කරන ලදී. |
| | - | ගෝ-කාර්ට් සහ ගෝ-කාර්ට් ටයර් ආනයනය මත වන සියයට 15 ක හෝ කිලෝග්‍රෑමයට රුපියල් 90 ක සෙස් බද්ද ඉවත් කරන ලදී. |

**විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද**

| | | |
|---|---|---|
| 2018 ජනවාරි 01 | - | පොතුහරින ලද දුඹුරු සහල්, සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් කෙටූ රළු සහල් (කැකුළු), නාඩු (රතු හෝ සුදු), සම්බා (රතු හෝ සුදු) සහ කැඩුනු සහල් ආනයනය සඳහා අය කළ කිලෝග්‍රෑමයට ශත 25 ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද 2018 මාර්තු 31 දක්වා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2018 ජනවාරි 19 | - | උම්බලකඩ, උඳු, මිරිස්, කොත්තමල්ලි ඇට, කහ, උඳු පිටි සහ ටින් මාළු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| | - | සියලුම වර්ගවල පෙරන්ගාන ලද හෝ පිටි කරන ලද කේජු ආනයනය සඳහා මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 200 ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් පනවන ලදී. |
| 2018 පෙබරවාරි 01 | - | ඉරිඟු ආනයනය සඳහා අය කළ කිලෝග්‍රෑමයට රුපියල් 10 ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද දින 31 ක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2018 පෙබරවාරි 16 | - | සීනි ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2018 පෙබරවාරි 24 | - | අර්තාපල් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද 2018 මාර්තු 31 දක්වා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 1 සිට කිලෝග්‍රෑමයට රුපියල් 30 දක්වා වැඩි කරන ලදී. |
| 2018 මාර්තු 08 | - | මැකරල් (මාළු), මෑ වර්ගයේ ඇට, කොණ්ඩ කඩල, කව්පි සහ කුරක්කන් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2018 මාර්තු 20 | - | උඳු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 60 සිට කිලෝග්‍රෑමයට රුපියල් 100 දක්වා වැඩි කරන ලදී. |
| 2018 අප්‍රේල් 01 | - | පොතුහරින ලද දුඹුරු සහල්, සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් කෙටූ රළු සහල් (කැකුළු), නාඩු (රතු හෝ සුදු), සම්බා (රතු හෝ සුදු) සහ කැඩුනු සහල් ආනයනය සඳහා අය කළ කිලෝග්‍රෑමයට ශත 25 ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද දින 31 ක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| | - | අර්තාපල් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| | - | යෝගට්, වෙඩරු, කිරිවලින් නිපදවූ තැවරුම්, සුදු ළූණු, අලුත් දොඩම්, අලුත් මිදි, අලුත් ඇපල්, උළුහාල් ඇට, කුරක්කන් පිටි, පොතු හරින ලද රටකජු, අබ ඇට සහ ලූණු ආනයන සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2018 මැයි 02 | - | පහත සඳහන් ආහාර ද්‍රව්‍ය ආනයනය සඳහා පනවා තිබූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි වැඩි කරන ලදී.<br>- අර්තාපල් කිලෝග්‍රෑමයට රුපියල් 30 සිට කිලෝග්‍රෑමයට රුපියල් 40 දක්වා<br>- බොම්බයි ළූණු කිලෝග්‍රෑමයට රුපියල් 1 සිට කිලෝග්‍රෑමයට රුපියල් 40 දක්වා |
| 2018 මැයි 08 | - | මැකරල්, තලපත්, කොප්පරා, තෝර සහ ශීර්ෂයේ කටු ගැලවූ මසුන් හැර අලුත් හෝ ශීත කළ මසුන්, මුංඇට, මැංගුස්ටින් (අලුත් සහ වියළි), දොඩම් (වියළි), පෙයාර්ස්, චෙරීස්, ප්ලම්ස් සහ ස්ලෝස්, කිවි ෆෘට්, හාල් මැස්සන් සහ කරවල ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |

| | | |
|---|---|---|
| 2018 මැයි 09 | - | රතු සහ කහ පරිප්පු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි පහත ආකාරයට වැඩි කරන ලදී.<br>- සම්පූර්ණ පරිප්පු කිලෝග්‍රෑමයට රුපියල් 1 සිට කිලෝග්‍රෑමයට රුපියල් 7 දක්වා<br>- පියලි කළ පරිප්පු කිලෝග්‍රෑමයට රුපියල් 3 සිට කිලෝග්‍රෑමයට රුපියල් 12 දක්වා |
| 2018 මැයි 21 | - | රතු ළූණු, රට ඉඳි (අලුත් සහ වියළි), මිදි (වියළි), සුදුරු බීජ, මහදුරු බීජ සහ මාගරින් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද වර්ෂයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2018 ජූනි 01 | - | එළවළු තෙල් ආනයනය සඳහා පනවා තිබූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 20 කින් වැඩි කරන ලදී. |
| 2018 ජූනි 14 | - | තලපත්, කොප්පරා, තෝර මාළු සහ පොල් මද ආනයනය සඳහා පනවා තිබූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස දොලහක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| | - | උඳු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස දොලහක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 100 සිට කිලෝග්‍රෑමයට රුපියල් 150 දක්වා වැඩි කරන ලදී. |
| 2018 ජූලි 19 | - | සියලුම වර්ගවල පෙරන්ගාන ලද හෝ පිටි කරන ලද කේජු, උම්බලකඩ, මිරිස්, කොත්තමල්ලි ඇට, කහ, උඳු පිටි සහ ටින් මාළු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස දොලහක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2018 අගෝස්තු 01 | - | ශීර්ෂයේ කටු ගැලවූ මසුන් හැර අලුත් හෝ ශීත කළ මසුන් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස දෙකක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි සියයට 10 හෝ කිලෝග්‍රෑමයට රුපියල් 100 යන දෙකෙන් වැඩි අගයේ සිට කිලෝග්‍රෑමයට රුපියල් 25 දක්වා සංශෝධනය කරන ලදී. |
| 2018 අගෝස්තු 09 | - | ඉරිඟු ආනයනය සඳහා මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 10 ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් පනවන ලදී. |
| 2018 අගෝස්තු 16 | - | සීනි ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2018 අගෝස්තු 25 | - | එළවළු තෙල් ආනයනය සඳහා පනවා තිබූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 20 කින් වැඩි කරන ලදී. |
| 2018 සැප්තැම්බර් 08 | - | මැකරල් (මාළු), මෑ වර්ගයේ ඇට, කොණ්ඩ කඩල, කව්පි සහ කුරක්කන් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද අවුරුද්දක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2018 සැප්තැම්බර් 18 | - | සීනි ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද වෙනුවට කිලෝග්‍රෑමයට රුපියල් 30 ක නිෂ්පාදන බද්දක්, කිලෝග්‍රෑමයට රුපියල් 12 ක ආනයන බද්දක්, සියයට 7.5 ක වරාය හා ගුවන්තොටුපළ සංවර්ධන බද්දක් සහ සියයට 2 ක ජාතිය ගොඩනැගීමේ බද්දක් පනවන ලදී. |
| 2018 ඔක්තෝබර් 01 | - | මාළු (අලුත් හෝ ශීත) ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද අවුරුද්දක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 25 සිට සියයට 10 හෝ කිලෝග්‍රෑමයට රුපියල් 100 යන දෙකෙන් වැඩි අගය දක්වා ඉහළ නංවන ලදී. |
| | - | යෝගට්, වෙඩරු, කිරිවලින් නිපදවූ තැවරුම්, සුදු ළූණු, අලුත් දොඩම්, අලුත් මිදි, අලුත් ඇපල්, උළුහාල් ඇට, කුරක්කන්, පොතු හරින ලද රටකජු, අබ ඇට සහ ලුණු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද අවුරුද්දක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |

| | | |
|---|---|---|
| 2018 නොවැම්බර් 02 | - | අර්තාපල් සහ බොම්බායි ළූණු සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද දින 31 ක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| | - | පහත සඳහන් ආහාර ද්‍රව්‍ය ආනයනය සඳහා පනවා තිබූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි අඩු කරන ලදී.<br>- සම්පූර්ණ කොණ්ඩ කඩල කිලෝග්‍රෑමයට රුපියල් 7 සිට කිලෝග්‍රෑමයට රුපියල් 2 දක්වා<br>- පියලි කළ කොණ්ඩ කඩල කිලෝග්‍රෑමයට රුපියල් 10 සිට කිලෝග්‍රෑමයට රුපියල් 5 දක්වා<br>- උඳු කිලෝග්‍රෑමයට රුපියල් 150 සිට කිලෝග්‍රෑමයට රුපියල් 125 දක්වා<br>- සම්පූර්ණ පරිප්පු කිලෝග්‍රෑමයට රුපියල් 7 සිට කිලෝග්‍රෑමයට රුපියල් 2 දක්වා<br>- පියලි කළ පරිප්පු කිලෝග්‍රෑමයට රුපියල් 12 සිට කිලෝග්‍රෑමයට රුපියල් 7 දක්වා |
| | - | සීනි ආනයනය සඳහා අය කළ කිලෝග්‍රෑමයට රුපියල් 30 ක නිෂ්පාදන බද්ද, කිලෝග්‍රෑමයට රුපියල් 12 ක ආනයන බද්ද, සියයට 7.5 ක වරාය හා ගුවන්තොටුපළ සංවර්ධන බද්ද සහ සියයට 2 ක ජාතිය ගොඩනැගීමේ බද්ද වෙනුවට පහත සඳහන් පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි පනවන ලදී.<br>- සුදු ස්ඵටිකකෘත උක් සීනි සහ සුදු ස්ඵටිකකෘත බීට් සීනි සඳහා කිලෝග්‍රෑමයට රුපියල් 32<br>- උක් සීනි සහ බීට් සීනි සඳහා කිලෝග්‍රෑමයට රුපියල් 35 |
| 2018 නොවැම්බර් 08 | - | මුංඇට, මැංගුස්ටින් (අලුත් සහ වියළි), දොඩම් (වියළි), පෙයාර්ස්, චෙරීස්, ප්ලම්ස් සහ ස්ලෝස්, කිවි ෆෘට්, හාල්මැස්සන් සහ කරවල ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2018 නොවැම්බර් 24 | - | පහත සඳහන් ආහාර ද්‍රව්‍ය ආනයනය සඳහා පනවා තිබූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි අඩු කරන ලදී.<br>- මෑ වර්ගයේ ඇට (සම්පූර්ණ) කිලෝග්‍රෑමයට රුපියල් 15 සිට කිලෝග්‍රෑමයට රුපියල් 5 දක්වා<br>- මෑ වර්ගයේ ඇට (පියලි කළ) කිලෝග්‍රෑමයට රුපියල් 18 සිට කිලෝග්‍රෑමයට රුපියල් 8 දක්වා |
| 2018 දෙසැම්බර් 03 | - | අර්තාපල් සහ බොම්බායි ළූණු ආනයනය සඳහා පනවා තිබූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 40 සිට කිලෝග්‍රෑමයට රුපියල් 20 දක්වා අඩු කරන ලදී. |
| 2019 පෙබරවාරි 02 | - | කොණ්ඩ කඩල (සම්පූර්ණ සහ පියලි කළ), රතු පරිප්පු (සම්පූර්ණ සහ පියලි කළ), කහ පරිප්පු (සම්පූර්ණ සහ පියලි කළ), බීට් සීනි, උක් සීනි, සුදු ස්ඵටිකකෘත උක් සීනි සහ සුදු ස්ඵටිකකෘත බීට් සීනි ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2019 පෙබරවාරි 08 | - | අර්තාපල් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 20 සිට කිලෝග්‍රෑමයට රුපියල් 50 දක්වා වැඩි කරන ලදී. |
| 2019 පෙබරවාරි 09 | - | ඉරිඟු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 10 සිට කිලෝග්‍රෑමයට රුපියල් 20 දක්වා වැඩි කරන ලදී. |
| 2019 මාර්තු 06 | - | ආනයනික පාම් තෙල් සඳහා දේශීය අගය එකතු කිරීම මත අදාළ වන ජාතිය ගොඩනැගීමේ බද්ද වෙනුවට විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පනවන ලදී. |

## වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද

2018 අප්‍රේල් 05 - අධිතාක්ෂණික උපකරණ හා යන්ත්‍ර සූත්‍ර ආනයන මත සියයට 2.5 ක සහනදායි වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්දක් පනවන ලදී.

2019 මාර්තු 06 - උසස් තාක්ෂණික යන්ත්‍රෝපකරණ හා උපාංග මත වන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද සියයට 7.5 සිට සියයට 2.5 දක්වා අඩු කරන ලදී.

- විනෝදාස්වාදය සඳහා භාවිතා කරන යාත්‍රා සහ නැව් නිෂ්පාදනය කරනු ලබන ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුම්ගත ආයතන විසින් සිය ව්‍යාපාරය ලෙස මෙම යාත්‍රා හා නැව් කුලියට දෙනු ලබන ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුම්ගත ව්‍යාපාර වෙත විකිණීමේදී අය කළ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද ඉවත් කරන ලදී.
- සංචාරක අංශය ප්‍රවර්ධනය කිරීම සහ දේශීය නිෂ්පාදන කර්මාන්ත අංශයේ මූලික පිරිවැය අවම කිරීමේ අරමුණින් යුතුව තෝරාගත් භාණ්ඩ කිහිපයක් සඳහා අය කළ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද අඩු කරන ලදී.
- මැණික් කැපීම සහ ඔප දැමීම සඳහා භාවිතා කරන යන්ත්‍ර මත වන වරාය හා ගුවන් තොටුපළ බද්ද ඉවත් කරන ලදී.
- ලූසර්න් (ඇල්ෆල්ෆා) ආහාර සහ තැටි ආනයනය මත අය කළ වරාය හා ගුවන් තොටුපළ බද්ද ඉවත් කරන ලදී.

## මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද

2019 මාර්තු 06 - බදු නිදහස් සීමාව ඉක්මවන ප්‍රමාණය මත පදනම්ව, ආනයනික මෝටර් රථ වාහන සඳහා පිරිවැය, රක්ෂණ හා නැව් ගාස්තු අගය (CIF Value) මත පදනම්වද, දේශීයව එකලස් කරන ලද වාහන සඳහා නිෂ්පාදන මිල මත පදනම්වද සුඛෝපභෝගී බද්ද පහත පරිදි පනවන ලදී.

| වාහන වර්ගය | සුඛෝපභෝගී බදු නිදහස් සීමාව | අනුපාතය (අ) |
|---|---|---|
| ඩීසල් | රුපියල් මිලියන 3.5 | 120% |
| පෙට්‍රල් | රුපියල් මිලියන 3.5 | 100% |
| දෙමුහුන් ඩීසල් | රුපියල් මිලියන 4.0 | 90% |
| දෙමුහුන් පෙට්‍රල් | රුපියල් මිලියන 4.0 | 80% |
| විද්‍යුත් | රුපියල් මිලියන 6.0 | 60% |

(අ) සුඛෝපභෝගී බදු නිදහස් සීමාව ඉක්මවා යන අගය මත අය කරනු ලබයි.

## කාබන් බද්ද

අපේක්ෂිත - වාණිජ වාහන මත ගෙවිය යුතු කාබන් බද්ද පහත පරිදි උපරිම සීමාවකට යටත් වේ.

| වාහන වර්ගය | වසර 5 ට අඩු | | වසර 5 සිට 10 දක්වා | | වසර 10 ට වැඩි | |
|---|---|---|---|---|---|---|
| | පවතින බද්ද | නව බද්ද | පවතින බද්ද | නව බද්ද | පවතින බද්ද | නව බද්ද |
| දෙමුහුන් (පෙට්‍රල්/ ඩීසල්) | ඝන සෙන්ටි-මීටරයට ශත 25 | ඝන සෙන්ටි-මීටරයට ශත 25 හෝ රුපියල් 3,500 යන දෙකෙන් අඩු අගය | ඝන සෙන්ටි-මීටරයට ශත 50 | ඝන සෙන්ටි-මීටරයට ශත 50 හෝ රුපියල් 5,500 යන දෙකෙන් අඩු අගය | ඝන සෙන්ටි-මීටරයට රුපියල් 1.00 | ඝන සෙන්ටි-මීටරයට රුපියල් 1.00 හෝ රුපියල් 7,500 යන දෙකෙන් අඩු අගය |
| ඉන්ධන (පෙට්‍රල්/ ඩීසල්) | ඝන සෙන්ටි-මීටරයට ශත 50 | ඝන සෙන්ටි-මීටරයට ශත 50 හෝ රුපියල් 3,500 යන දෙකෙන් අඩු අගය | ඝන සෙන්ටි-මීටරයට රුපියල් 1.00 | ඝන සෙන්ටි-මීටරයට රුපියල් 1.00 හෝ රුපියල් 5,500 යන දෙකෙන් අඩු අගය | ඝන සෙන්ටි-මීටරයට රුපියල් 1.50 | ඝන සෙන්ටි-මීටරයට රුපියල් 1.50 හෝ රුපියල් 7,500 යන දෙකෙන් අඩු අගය |

## ඔට්ටු හා සූදු බද්ද

අපේක්ෂිත
- රූජිනෝ හැර අනෙකුත් සූදු ව්‍යාපාර පවත්වාගෙන යෑම වෙනුවෙන් අය කරනු ලබන වාර්ෂික ගාස්තුව රුපියල් මිලියන 200 සිට රුපියල් මිලියන 400 දක්වා ඉහළ නැංවීම
- රූජිනෝ සූදු ව්‍යාපාර පවත්වාගෙන යෑම වෙනුවෙන් රුපියල් මිලියන 1 ක වාර්ෂික ගාස්තුවක් පැනවීම
- කැසිනෝ සඳහා වන ඇතුළත් වීමේ ගාස්තුව එක් පුද්ගලයෙකුට එ.ජ.ඩො. 100 සිට එක් පුද්ගලයෙකුට එ.ජ.ඩො. 50 දක්වා අඩු කිරීම
- දළ එකතුව මත වන බද්ද සියයට 10 සිට සියයට 15 දක්වා ඉහළ නැංවීම.

## අනෙකුත් බදු සහ අය බදු

අපේක්ෂිත
- ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද ඉවත් කිරීම
- අපගමන බද්ද එක් මගියෙකු සඳහා එ.ජ.ඩො. 60 දක්වා එ.ජ.ඩො. 10 කින් වැඩි කිරීම.

## වෙනත් ගාස්තු සහ අය කිරීම්

2018 ජනවාරි 01 - වාර්ෂික මත්පැන් බලපත්‍ර ගාස්තු සංශෝධනය කරන ලදී.

| | | |
|---|---|---|
| 2018 අප්‍රේල් 01 | - | රා බෝතල් කිරීමේ වාර්ෂික බලපත්‍ර ගාස්තුව රුපියල් 1,000,000 සිට රුපියල් 500,000 දක්වා අඩු කරන ලදී. |
| 2018 අප්‍රේල් 16 | - | ගස් මැදීමේ බලපත්‍ර ගාස්තු හඳුන්වා දෙන ලදී. |
| අපේක්ෂිත | - | පසුගිය වසර තුනක කාලය තුළ ගාස්තු සහ අය කිරීම් සංශෝධනය නොකළ රාජ්‍ය ආයතනවලල ගාස්තු සහ අය කිරීම් සියයට 15 කින් ඉහළ නැංවීම. |
| | - | විදේශ ගමන් බලපත්‍ර ගාස්තු පහත පරිදි සංශෝධනය කරනු ලැබේ<br>- වෙනස් කිරීම් ගාස්තු ඒකකයට රුපියල් 500 සිට ඒකකයට රුපියල් 1,000 දක්වා<br>- සැකසුම් ගාස්තු (හදිසි පදනම මත) ඒකකයට රුපියල් 10,000 සිට ඒකකයට රුපියල් 15,000 දක්වා<br>- සැකසුම් ගාස්තු (සාමාන්‍ය පදනම මත) ඒකකයට රුපියල් 3,000 සිට ඒකකයට රුපියල් 3,500 දක්වා |

## රාජ්‍ය වියදම

| | | |
|---|---|---|
| 2018 පෙබරවාරි 21 | - | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නියුතු වෘත්තිකයන් හට වරලත් ඉංජිනේරු දීමනාව ලබා දීම සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 04/2018 නිකුත් කරන ලදි. |
| 2018 මැයි 04 | - | 2018 ජුනි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මරණ පාරිතෝෂික අයදුම්පත් මාර්ගගතව යොමු කළ හැකි වන ලෙස විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 09/2015 (සංශෝධන III) නිකුත් කරන ලදී. |
| 2018 මැයි 24 | - | විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය විධිමත් හා කඩිනම් කිරීම සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2018 නිකුත් කරන ලදී. |
| 2018 ජුනි 24 | - | අනතුරුදායක රැකියාවල නිරත වීමේදී හෝ තනතුරට පැවරී ඇති රාජකාරී ඉටු කිරීමේදී වැළඳෙන රෝග හේතුවෙන් මරණයට පත්වන රාජ්‍ය නිලධාරීන්ගේ යැපෙන්නන්ට වන්දි ලබා දීම සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 08/2018 නිකුත් කරන ලදී. |
| අපේක්ෂිත | - | රාජ්‍ය අංශයේ සියලුම සේවකයන් සඳහා රුපියල් 2,500 ක මාසික අන්තර් දීමනාවක් ලබා දීම |
| | - | විශ්‍රාම යන අවස්ථාවේදී විශ්‍රාමිකයෙකු ලබා ගන්නා මූලික වැටුපට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි සඳහන් මුල් අදියර දෙක ඇතුළත් වන පරිදි විශ්‍රාම වැටුප් ගෙවීම් සංශෝධනය කිරීම |

## රාජ්‍ය ණය කළමනාකරණය

| | | |
|---|---|---|
| 2018 ජනවාරි 09 | - | 2018 වසර සඳහා එ.ජ. ඩොලර් මිලියන 3,000 සීමාවක් දක්වා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කිරීමට අනුමැතිය ලබා දෙන ලදී. |
| 2018 මාර්තු 27 | - | ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර හා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම තුළින් විදේශ මුදලින් ණය රැස්කිරීම සඳහා වූ එ.ජ.ඩොලර් මිලියන 5,000ක සමස්ත සීමාව යටතේ, 2018 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 2,500 දක්වා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී |
| 2018 මාර්තු 28 | - | 2018 අංක 08 දරන සක්‍රීය වගකීම් කළමනාකරණ පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී. |
| 2018 ඔක්තෝබර් 26 | - | 2018 අංක 8 දරණ සක්‍රීය වගකීම් කළමනාකරණ පනත අනුව රුපියල් බිලියන 310 ක් දක්වා අරමුදල් රැස්කිරීම සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාව පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී. |

**අනෙකුත්**

| | | |
|---|---|---|
| 2018 ජූලි 12 | - | මෝටර් වාහන ආනයනය, නිෂ්පාදනය හෝ එකලස් කිරීම සඳහා වන වාහන විමෝචන ප්‍රමිති හඳුන්වා දීම සඳහා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් අංක 2079/42 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය නිකුත් කරන ලදී. |
| 2018 ජූලි 13 | - | මෝටර් වාහන ආනයන සඳහා විමෝචන ප්‍රමිති සහ ආරක්ෂක ක්‍රියාමාර්ග හඳුන්වා දීම සඳහා ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් අංක 2079/70 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය නිකුත් කරන ලදී. |
| 2018 නොවැම්බර් 01 | - | 2018 අංක 35 දරණ මුදල් පනත පාර්ලිමේන්තුව විසින් නීතිගත කළ අතර එමගින් වාහන හිමිකම් අය බද්ද, කාබන් බද්ද, වාර්ෂික සමාගම් ලියාපදිංචි කිරීමේ අය බද්ද, ණය ආපසු ගෙවීමේ බද්ද, දුරකථන සන්නිවේදන කුළුණු අය බද්ද සහ ජංගම දුරකථන කෙටි පණිවුඩ සේවා මත අය බද්ද පනවන ලද අතර මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද සංශෝධනය කරන ලදී. |